# අද්‍යතන පවුල් සංස්ථාවෙහි මාතෘ භූමිකාව සහ සිංහල ගීතයඃ සමාජීය සාහිත්‍ය අධ්‍යයනයක්

ඩබ්ලිව්. එම්. නදීශා දර්ශනී වීරසිංහ

**හැඳින්වීම**

පුද්ගලයා උපතේ සිට මරණය දක්වා යාවජීව සබඳතා පවත්වන පවුල මානව සමාජයේ කේන්ද්‍රීය සමාජ ඒකකයයි. පවුල නිර්මාණය වී ඇත්තේ මව සහ පියා යන භූමිකා යුගලය ප්‍රධාන කොට ගෙනය. එයින් පෙරදිග සමාජයේ මාතෘත්වයට හිමි වන්නේ සුවිශේෂ ආස්ථානයකි. පවුල් සංස්ථාවේ ප්‍රධාන සංරචකයක් වන මව පිළිබඳ අවධානය යොමු කිරීමට පෙර පවුල් සංස්ථාවේ ව්‍යුහය පිළිබඳ අවධානය යොමු කිරීම යෝග්‍යය.

පුද්ගලයාගේ ප්‍රභවාත්මක සාධකයක් වන පවුලේ ප්‍රභවය පිළිබඳ නිශ්චිත අනාවරණයක් නොමැති වුවද, එය මානව පරිණාමයේ සුවිශේෂ සන්ධිස්ථානයක් ලෙස සැලකෙයි. පුද්ගල සමාජානුයෝජනයේ ප්‍රධාන කාරකයක් වශයෙන් භෞතික සහ ආධ්‍යාත්මික වශයෙන් පුද්ගලයා වෙනුවෙන් නෛතිකව බැඳී සිටින ක්ෂුද්‍ර සමාජ ඒකකය පවුලයි. පවුල, ව්‍යුහමය වශයෙන් මූලික පවුල සහ විස්තෘත පවුල වශයෙන් ප්‍රධාන ප්‍රවර්ග යුගලයකි. ගෝලීය සහ ජාතික වශයෙන් සිදු වූ සමාජ, ආර්ථික, දේශපාලන ගතිකතා හේතුවෙන් පවුලේ කාර්ය කොටස් සංකෝචනය සහ විමෝචනය වීමෙන් පවුලේ ව්‍යුහාත්මක විවිධතා ඇති විය. සිංහල සමාජයේ නූතන පවුල් සංස්ථාවෙහි නෛසර්ගික වටිනාකම පිළිබඳ අභියෝගාත්මක තත්වයක් නිර්මාණය වීම එහි ප්‍රබලම ගැටලුවයි. පවුල එහි ප්‍රභවය සහ විකාශනය පිළිබඳ සමාජ විද්‍යාත්මක සහ මානව විද්‍යාත්මක අර්ථකථන සහ අද්‍යතන පවුල පිළිබඳ නිරීක්ෂණ ඇසුරින් අධ්‍යයනයට ප්‍රස්තුත වන පවුල පිළිබඳ මෙහිදී අවධානයට ලක් කෙරිණි.

ඒ ඒ සමාජවල භාෂාවල පවුල හැඳින්වීමට විවිධ නාම ව්‍යවහාර කරයි. සිංහල භාෂාවේ පවුල හැඳින්වීම සඳහා යොදන පර්යාය අතර කුටුම්භය, කුලගෙදර, පතිකුලය (අභයසුන්දර, 2003) වෙයි. ඉංග්‍රීසි භාෂාවෙහි "ෆැමිලි" ලෙස ද ද්‍රවිඩ භාෂාවෙන් "කුඩුම්බම්" ලෙස ද පවුල හඳුන්වයි.

පවුල යනු විවාහය ලේ ඥාතීත්වය හෝ දරුකමට හදාගැනීම යන බැඳීම්වලින් බැඳුණු පුද්ගල කණ්ඩායමකි. තනි නිවසක් පිහිටුවා ගනිමින්, සාමාන්‍යයෙන් අඹු සැමියන් දෙමාපියන් දරුවන් සහ සහෝදර සහෝදරියන් සමාජීය තත්තවයන්ට ගරු කරමින් එකිනෙකා සමග ක්‍රියා කරයි. පවුලේ සංවිධානාත්මක බව සහ අන්‍යොන්‍ය වගකීම යන ප්‍රධාන කරුණු යුගලය පවුල පිළිබඳ බ්‍රිටැනිකා විශ්වකෝෂ අර්ථකථනයෙහි සංක්ෂිප්තාර්ථයයි. පවුල සංවිධානාත්මක පුද්ගල එකතුවක් බව දක්වන්නේ එය විවාහය හෝ ලේ ඥාතීත්වය පදනම් කර ගත්තක් ලෙස දැක්වීමෙනි. නූතනයේ කුටුම්භයක් සකස් වීමෙහි ලා විවාහය නෛතික පදනම ලෙස සැලකෙන අතර අතීතයේ දී නෑනා- මස්සිනා විවාහය සහ විවාහක යුවලගේ දරුවන් පවුල් සංස්ථාවක් නිර්මාණයට පාදක වන ලේ ඥාතීත්ව සාධක විය. මෙහි අර්ථ දක්වන්නේ මූලික පවුල හෙවත් පවුල් සංස්ථාවෙහි කේන්ද්‍රීය අවයවලින් පමණක් සමන්විත න්‍යෂ්ටික පවුල පිළිබඳවයි. පවුල ව්‍යුහාත්මක පුද්ගල එකතුවක් පමණක් නොවේ. එය අන්‍යොන්‍ය යුතුකම් වගකීම්වලින් සැදුම්ලත් ඒකකයකි. අනෙකාගේ සමාජ තත්වය ගරු කිරීම සහ අන්‍යොන්‍ය වශයෙන් ක්‍රියාකාරී වීම වැනි සමාජ ධර්මතා පවුලෙහි පැවැත්ම තහවුරු කරයි.

උක්ත අර්ථකථනයට බොහෝ දුරට සමානාර්ථයක් ඔක්ස්පර්ඩ් විශ්වකෝෂ නිර්වචනයෙන් ද දක්වා තිබේ. ඒ අනුව දෙමව්පියන් එක් අයෙකු හෝ දෙදෙනෙකු සහ ඔවුන්ගේ දරුවන්ගෙන් සමන්විත කණ්ඩායම පවුල ලෙස පෙන්වා දී ඇත. පවුලේ ව්‍යුහාත්මක සැකසුම

ස්ත්‍රී- පුරුෂ යුවලක් සහ ඔවුන්ගේ දරුවන් යන්න මින් සංක්ෂිප්ත ව විග්‍රහ කරයි. බ්‍රිටැනිකා විශ්වකෝෂ අර්ථකථනයේ සඳහන් පවුල සකස් වීමේ පදනම මෙහි ඍජුව ඉස්මතු නො කරයි. එහෙත්, දෙමව්පියන් බවට පත් වීමෙහි ලා සමාජය විසින් නෛතික හෝ සදාචාරාත්මක ව පිළිගත් ආකෘතියක් අවශ්‍ය හෙයින් විවාහයක් මගින් විධිමත් ව සංවිධානගත වීමද මෙහි අන්තර්ගතය. දෙමව්පියන් දෙදෙනෙකු හෝ එක් අයෙකු ලෙස දැක්වීමෙන් පරම්පරා දෙකකින් යුතු පවුලේ විස්තෘත ස්වරූපයක් ප්‍රකට කරයි.

පවුල මූලික සමාජ සංස්ථාව වශයෙන් සමාජ විද්‍යාවේ පර්යේෂණාත්මක අර්ථ දැක්වීම්වලට පදනම් වූවකි. ජෝර්ජ් පී. මර්ඩොක්ගේ අර්ථ දැක්වීම් ඒ අතර ප්‍රමුඛය. අවම වශයෙන් ලිංගික සබඳතා පැවැත්වීම සඳහා සමාජ අනුමැතිය ලත් ලිංග දෙකකට අයත් දෙදෙනෙක් ඔවුන්ගේ දරුවන් හෝ දරුකමට හදාගත් දරුවන්ගෙන් යුතු සමූහයකි (මර්ඩොක්, 1949).

පවුල යනු අවම වශයෙන් ලිංගික සබඳතා පැවැත්වීම සඳහා සමාජ අනුමැතිය ලත් ලිංග දෙකකට අයත් දෙදෙනෙක් ලෙස අර්ථ දක්වා ඇත්තේ, සමාජ සම්මතයට අනුව විවාහයෙන් සම්බන්ධ වන ස්ත්‍රී- පුරුෂ දෙපාර්ශවයයි. මෙරට සමාජ පරිසරය අනුව 'සමාජ අනුමැතිය ලත්' යන්නෙන් අදහස් කරන්නේ, නිසි වයස ප්‍රධාන ව සමාජ, සංස්කෘතික වශයෙන් සලකා බලන වෘත්තිය, කුලය වැනි සාම්ප්‍රදායික සහ අනන්‍ය සමාජ සංස්කෘතික පිළිගැනීම්වලින් සමන්විත යන්න යි. ජීවවිද්‍යාත්මක අවශ්‍යතාවක් වන ලිංගික සබඳතා පැවැත්වීමෙහි අයිතිය නීත්‍යානුකූල ව තහවුරු කරන්නේ ද සමාජ පිළිගැනීම ගොඩනැගෙන්නේ ද විවාහයෙනි.

ලිංගික සබඳතා පැවැත්වීම, ප්‍රජනනය සහ දරුවන්ගේ නීත්‍යානුකූල භාරකාරත්වය, අයිතිවාසිකම්, ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයෙහි ආරක්ෂාව, සෞඛ්‍යය සුරක්ෂිත කිරීම උදෙසාද චින්තනමය වශයෙන් මෙන්ම සමාජයීය වශයෙන් වාරණයක් පැවතීම ශිෂ්ටාචාරවත් සමාජයක අවශ්‍යතාවක්ය යන්න ආසියාතික සංස්කෘතියේ පිළිගැනීමයි. නූතන ප්‍රවනතා සහ පුද්ගල නිදහස වැනි මතවාදවලින් මෙම තත්වය විවේචනය කළද මර්ඩොක් දක්වන ආකාරයට පවුල විධිමත් ලෙස ගොඩනගා ගත යුත්තකි. පවුල සමන්විත වන්නේ ස්වාමියා, භාර්යාව සහ ඔවුන් බිහි කළ හෝ දරු කමට හදා ගත් දරුවන්ගෙන් යුතු සමූහයකිනි. පවුලෙහි ක්ෂුද්‍රම අවස්ථාව වන න්‍යෂ්ටික පවුල මර්ඩොක් පවුල ලෙස දක්වයි. මෙම අධ්‍යයනයෙහිදී අවධානය යොමු වූයේද න්‍යෂ්ටික පවුල වෙතයි.

ඥාතීත්ව ලෙස අදහස් කරන්නේ මව, පියා, දූ දරුවන් සහ ආච්චි, සීයා, නැන්දා, මාමා වශයෙන් දැක්වෙන මූලික පවුලෙහි සහ විස්තෘත පවුලෙහි ලේ ඥාතීත්ව සහ විවාහය වැනි විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ සම්බන්ධ වන සම්බන්ධතා ලෙස හැඳින්විය හැකිය. පුද්ගලයින් දෙදෙනා යනු පවුලක් නිර්මාණය වීමට බලපාන අත්‍යවශ්‍ය ස්ත්‍රී- පුරුෂ දෙපාර්ශවය වන ස්වාමියා සහ භාර්යාවයි. මේ අනුව ස්වාමි-භාර්යා දෙදෙනා පමණක් හෝ අවශේෂ ඥාතීන්ගෙන්ද සමන්විත ඒකකය පවුල වශයෙන් හැඳින්විය හැකිය. මෙම පාර්ශව එක්වී ගොඩනගන සංවිධානය සමාජය විසින් පිළිගනු ලබන තත්වයට පත් කිරීමට කිසියම් නෛතික හෝ සංස්කෘතිකමය යාන්ත්‍රණයක් මගින් එකිනෙකා සම්බන්ධ විය යුතු බව ද මෙයින් අදහස් කරයි.

උක්ත අර්ථ දැක්වීම් සියල්ලගේම පවුල ලෙස සඳහන් කර තිබෙන්නේ, මව, පියා, දූදරුවන්ගෙන් සැදුම්ලත් ව්‍යුහාත්මක ඒකකයකි. මූලික පවුල ලෙස දැක්වෙන මෙය නූතන ප්‍රවනතාවක් වන න්‍යෂ්ටික පවුල ලෙසද හැඳින්වේ. පවුලෙහි වාස්තවික සැකසුම මෙන්ම අභ්‍යන්තර

ක්‍රියාකාරීත්වය කැත්ලීන් ගෆ්, විලියම් ජේ. ගුඩ් සහ පීටර් මර්ඩොක් යන සමාජ විද්‍යාඥයින්ගේ විශේෂ අවධානයට ලක් විය.

"මානව සමාජයේ විධිමත් ආකාරයට වර්ධනය වන එකම සමාජ සංස්ථාව පවුල වේ"(ගුඩ්, 1964). සාපේක්ෂව සෑම නිර්වචනයකම පාහේ දැක්වෙන පවුලෙහි විධිමත් ස්ථාපනය මෙන්ම, එහි විකාසනය කෙරෙහිද අවධානය යොමු කෙරිණි. මූලික පවුල වශයෙන් පැවතියද, විස්තෘත ඒකකයක් වුවද එකිනෙකා අතර ගොඩනැගෙන අන්‍යෝන්‍ය සබඳතාවලින් සහ ජීවිතානුභූතිවලින් සුසංවිධිතව පවත්වාගෙන යාම පවුල් සංස්ථාවක විධිමත් බවෙහි ලක්ෂණයකි. පවුලේ කෘත්‍යාත්මක අනන්‍යතා සහ අරමුණු එහි විධිමත් බව ඇති කරන සාධක වශයෙන් සමාජ විද්‍යාවේ සහ මානව විද්‍යාවේ සඳහන් කරයි. සංස්කෘතික සමාජවල සමාජ සම්මත මගින් පවුලෙහි අරමුණු තීරණය කිරීම සහ කාර්යය පැවරීම සිදු කරයි.

පවුල භාවමය සහ කාර්යමය වශයෙන් බැඳුණු සංස්ථාවක් වශයෙන් එහි විවිධ කෘත්‍යාත්මක පැවරීම් සම්බන්ධව ඒ ඒ නිර්වචනවල සංක්ෂිප්ත ව සඳහන් කර තිබිණි. පවුලේ කෘත්‍යයන් පිළිබඳ මැක් අයිවර්, කිංස්ලි ඩේවිස්, ඔක්බර්න් සහ නිම්කොෆ් වැනි සමාජ විද්‍යාඥයන් කිහිප දෙනෙකුම විශේෂයෙන් අදහස් දක්වා ඇත.

මර්ඩොක් විසින් පර්යේෂණාත්මකව සිදු කරන ලද අර්ථ දැක්වීම සුවිශේෂය." පවුල යනු පොදු වාසය, ලිංගික කෘත්‍යය, ප්‍රජනනය, සමාජානුයෝජනය සහ ආර්ථික සංයෝගීතාවය කාර්යය කොටගත්තකි"(මර්ඩොක්, 1949). පවුලේ කෘත්‍ය පිළිබඳ සාපේක්ෂ ව සාර්ථක කරුණු දැක්වීමක් මර්ඩොක් සිදු කර තිබේ. ටැල්කොට් පාර්සන්ස්, මර්ඩොක්ගේ අර්ථකථනයේ සාරාංශගත අරුතක් වශයෙන් පවුලේ ප්‍රධාන කාර්යභාර 4ක් දක්වා ඇත. ජීව විද්‍යාත්මක කාර්යය,

ආර්ථික කාර්යය, සංස්කෘතික කාර්යය සහ මනෝවිද්‍යාත්මක කාර්යය වශයෙන් එය සඳහන් කරයි (Parsons,1971ː උද්ධෘතයː පෙරේරා, 2014).

පාර්සන්ස් දක්වන සංස්කෘතිකමය සහ මනෝවිද්‍යාත්මක කාර්යය ඔස්සේ දෙවන පරපුර වෙත සංස්කෘතිය සම්ප්‍රේෂණය කළ යුත්තේ පුද්ගල සමාජානුයෝජන කාරකය වන පවුල මගිනි. "...පවුලේ සාමාජිකයන් භෞතික වශයෙන් නඩත්තු කිරීම දරුවන්ට සමාජ අනන්‍යතාව පැවරීම සමාජානුයෝනය සහ සමාජ පාලනය එහි කාර්යය වශයෙන් ඕනෑම සමාජයක පවති යි (ගුඩ්, 1964). 1971 දී ටැල්කොට් පාර්සන්ස් සමාජයේ මධ්‍යගත කාර්යභාරයක් ඉටු කරන පවුලේ විශ්වීය කාර්යයන් දෙකක් ලෙස සමාජානුයෝජනය සහ පෞරුෂ වර්ධනය පිළිබඳ දක්වා තිබේ (Parsons,1971ː උද්ධෘතයː පෙරේරා, 2014). දෙමව්පියන් ප්‍රධාන පවුලේ වැඩිහිටියන්ගේ ජීවන පරිචය ඇසුරින් දෙවන පරම්පරාව වෙත ඉටු කරන සමාජානුයෝජනය ප්‍රධාන පවුලේ කෘත්‍යයන්ගේ සාධනීය ඵලාප්ති ලෙස සැලකිය හැකිය.

සිංහල සමාජයේ පවුල් සංස්ථාව පිළිබඳ අධ්‍යනයේදී පැහැදිලි වන්නේ සංස්කෘතික පැවරීම් මගින් මෙම කාර්යය සහ අරමුණු බලපැවැත්වෙන බවයි. සංස්කෘතික නියාමන අනුව සාරධර්ම, සම්මත වශයෙන් ද ආගමික වශයෙන් ගත් කල යුතුකම්- වගකීම් ලෙස ද මෙම පැවරීම් සිදු වෙයි.

පවුලේ සම්භවය පිළිබඳ අධ්‍යයන සමාජ විද්‍යා, මානව විද්‍යා සහ මනෝ විද්‍යා විෂයයන් සමග බැඳී පවතියි. එම අධ්‍යයන අනුව පවුල බිහි වී ඇත්තේ ගෝත්‍රික වනගත ජීවිත ගත කළ අවධිය නිමා කරමිනි. ප්‍රාග් මානවයාගේ ජීවිත සීමිත අවශ්‍යතා සහිත සරල සහ අවිධිමත් එකකි. වස්ත්‍ර, ස්ථිර වාසස්ථාන, විධිමත් මානව සබඳතා පිළිබඳ එකල අවධානය යොමු නොවිණි. ගණ ගෝත්‍ර ක්‍රමයට පෙර පැවති ආදි කල්පිත

අවධියේ දී ස්ත්‍රී- පුරුෂ සම්බන්ධතා අක්‍රමික ව පැවති බැවින් පවුලක් යැයි හැඳින්විය හැකි ඒකකයක් නොවිණි. " පවුල සමාජමය අංගයක් ලෙස පළමුවෙන්ම පැන නැංගේ ආදි කල්පිත සමාජයේදී ය" (කරුණාතිලක, 2011) යන්න ඇතැමෙකුගේ මතයයි. පවුලේ ස්වරූපයකට සමාන ආකෘතියක් එකල නිර්මාණය වන්නට ඇති අතර පසුකාලීනව ක්‍රමිකව වර්ධනය වන්නට ඇත.

ප්‍රාථමික සමාජානුයෝජනයේ මූලික සමාජානුයෝජනය සිදු වන්නේ මවගෙනි. පවුලක් තුළ පවතින මානව සබඳතා අතුරින් මව- පියා- දූ දරුවන් අතර වන සම්බන්ධතාව සුවිශේෂ ය. විවාහයේ අරමුණ වන්නේ ද ස්ත්‍රිය මවක වීම සහ පුරුෂයා පියෙකු වීම යි. මානව පරපුරේ පැවැත්ම තහවුරු කරන "මාතෘ පීතෘත්වය විවාහ ජීවිතයෙහි පරමාර්ථය යි"(ආරියපාල, 2014:296). යන්න තුන්කල්හි ම පවතින්නකි. දෙමව්පියන් සහ දරුවන් අතර නිර්මාණය වන සබඳතාව කායික සබඳතා අභිභවා ගිය භාවාත්මක සහ මානුෂීය බැඳීමකි. එය අන්‍යොන්‍ය වශයෙන් පවතින්නකි. ආගමික සහ සංස්කෘතික සදාචාරධර්ම අනුව දෙමාපියන් විසින් දරුවන් කෙරෙහි පැවතිය යුතු ක්‍රමවේදයක් ද, දරුවන් දෙමව්පියන් විෂයෙහි පැවතිය යුතු ක්‍රමවේදයක් ද වෙයි. මව සහ දරුවන් අතර ගොඩනැගෙන සබඳතාව පියා සහ දරුවන් අතර ගොඩනැගෙන සබඳතාව ජීවවිද්‍යාත්මක සහ සංස්කෘතික අනන්‍යතා සහිත වූවකි (රාමණායක, 2006). දරුවන් දෙමව්පියන් කෙරෙහි දක්වන ආකල්පය ද පවුල් සංස්ථාවේ සාරාර්ථය ඉස්මතු කරයි. නූතන සමාජ විපරිවර්තන හමුවේ එම බැඳීම බොහෝ දුරට උපකරණීය තත්වයට පත් වී තිබේ. ගීත රචකයින් ස්වකීය අනුභූති සඳහා ප්‍රස්තුත කර ගත් මව්-පිය දූදරු සබඳතාවයෙහි ස්වරූපය මානසික සහ ජීවවිද්‍යාත්මක තත්ව කෙරෙහි අවබෝධයෙන් යුතු ව සාකච්ඡා කිරීම මෙහි දී සිදු කරයි.

දරුවා මෙලොවට බිහි වීමටත් පෙර කළල අවධියේ දී ම ගොඩ නැගෙන මව්- දරු සබඳතාවය දරුවාගේ අභාෂක ලෝකයේ සියලු සංවේදන වටහා ගැනීමට තරම් සියුම් වූවකි. සිග්මන් ෆ්‍රොයිඩ් දක්වන පරිදි මානවයාගේ පැවැත්මේ සහ සංවර්ධනයේ සුවිශේෂ කායික මානසික සබඳතාවක් නිර්මාණය වන්නේ මව සමඟය (රාමණායක,2006). මානව දරුවෙකු බහ තෝරන වියේ දී පළමුව උච්චාරණය කරන්නේ ද 'අම්මා' යන පදය යි. ඇගේ ස්වභාවික කායික සැකසුම ද, මානසික සංවේදීතාව ද මිනිසාගේ ආරම්භක සංවේදන කෙරෙහි බලපෑම් කරයි. පූර්ව ප්‍රසව අවධියේ සිටම මව සමග පවතින සබඳතාව දරුවාගේ සාමාන්‍ය පැවැත්මට උපකාරයක් වන බව ද මනෝවිද්‍යාත්මක මෙන් ම ජීවවිද්‍යාත්මක අනාවරණයකි (පෙරේරා, 2002). ගීත රචකයා මෙම කරුණු පිළිබඳ සංවේදී වෙමින් ද, විචාරශීලී වෙමින් ද ගීත නිර්මාණය කර ඇත. මව දරුවා විෂයෙහි දක්වන ආදරය, සිදු කරන පරිත්‍යාග සහ සුරක්ෂිත කරන රැකවරණය වැනි මාතෘත්වයේ බහු විධ මාන ගීත මගින් හෙළි වන ආකාරය විග්‍රහ කරයි.

ජාතක කථා පොතෙහි සෝනන්ද ජාතකයෙහි මවගේ වගකීම ප්‍රකට වන වචන සතරක් දක්වයි. ඒ අනුව, දරුවා කෙරෙහි පළමුවෙන් ම ආදරය දක්වන්නී හෙයින් අම්මා ලෙස හඳුන්වයි. කාන්තාවක තුළ ප්‍රථම දාරක ස්නේහය හට ගන්නේ ඇය පිළිසිඳගෙන දොළදුක ඇති වීමත් සමග ය. ඇය දරුවා බිහි කරන හෙයින් ජනෙත්ති නමින් ද, දරුවා සතුටු කරන හෙයින් තෝසෙන්ති නමින් ද, දරුවාට කිරි ලබා දී නිසි කායික පෝෂණය ඇති කරන හෙයින් පෝසෙන්ති නමින් ද හැඳින් වේ. මව සහ දරුවෙකු අතර ගොඩනැගෙන සබඳතාවයෙහි සංකීර්ණත්වය ඉන් පැහැදිලි ය (උඩුහාවර, 2013).

ගීත රචකයින් ස්වකීය අනුභූති සඳහා ප්‍රස්තුත කර ගත් මව්- දූදරු සබඳතාවයෙහි ස්වරූපය, අද්‍යතන මුහුණුවර කෙරෙහි බලපාන

මානසික, ජීවවිද්‍යාත්මක සහ සමාජයීය තත්ව කෙරෙහි අවබෝධයෙන් යුතු ව සාකච්ඡා කිරීම මෙහිදී සිදු කරයි. සමාජ විපරිවර්තනයේ සංධිස්ථානයක් වූ ද, ගීත සාහිත්‍යයේ දියුණු අවධියක් වූ ද 70-80 දශකද්වය ප්‍රමුඛව වර්තමානය තෙක්ම කුටුම්භ තුළ මාතෘ භූමිකාව ප්‍රතිනිර්මාණය කිරීමෙහි ලා ගීත රචකයින් යොමු වී ඇත.

## නූතන පවුල් ආකෘති සහ ගැටලු

පවුල් සංස්ථා සමාජ, ආර්ථික, දේශපාලන වෙනස්වීම් හේතුවෙන් පවුල් සංස්ථාවේ ව්‍යුහාත්මක සහ කාර්යමය වශයෙන් ගතික බවක් ඇති විය. මුල් අවධියේ ගණ ගෝත්‍ර වශයෙන් ඒකරාශී වූ මිනිසා පවුල් සංස්ථාවක් පිහිටවා ගත් පසුවද, විවාහක යුවල පමණක් නොව අවශේෂ ඥාති සමූහයාගෙන්ද සමන්විත විය. මර්ඩොක් දක්වන පරිදි විස්තාරිත පවුල යනු න්‍යෂ්ටික පවුල් දෙකකට වැඩි ගණනක් දරුවන් සමග එක්ව ජීවත් වීමයි (පෙරේරා, 2014ෘ 90). ගෝලීය සමාජ වෙනස්වීම වික්ටෝරියානු සංස්කෘතිය සමග ලාංකීය සමාජයටද අන්තර්ග්‍රහණය වුවද, ලංකාවේද නූතන යුගයේ මුල් අවධියේදී පවා වැඩි වශයෙන් පැවතියේ විස්තෘත පවුල් ඒකකයි. "දීර්ඝ යටත්විජිත අවධියේදී මෙරට න්‍යෂ්ටික පවුල් ක්‍රමය ස්ථාපිත වුවද 1948 නිදහස ලබන විටත් ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල මුළුමනින්ම න්‍යෂ්ටික පවුල් නිර්මාණය වී නොතිබිණි" (Yalman, 1971). එහෙත්, මර්ඩොක් සිය පර්යේෂණයේ දක්වන පරිදි ලොව බහුලවම පැවති පවුල් වර්ගය ලෙස න්‍යෂ්ටික පවුල හඳුනා ගැනීමෙන් පැහැදිලි වන්නේ, ගෝලීය වශයෙන් පවුලේ න්‍යෂ්ටික ස්වරූපය සමකාලීනවම ව්‍යාප්ත වී තිබූ බවයි. 'එදාහෙළදිව', 'මධ්‍යකාලීන ලංකා සමාජය' වැනි ග්‍රන්ථවල දැක්වෙන ලාංකීය ඓතිහාසික සමාජයේ සුලබව පැවති විස්තෘත පවුල වර්තමානයේදී ඉතාමත් දුලබව නමුදු දක්නට ලැබේ.

ලිබරල්වාදයේ ප්‍රතිඵලයක් වූ ගෝලීයකරණයේ බලපෑම ගෝලීය වශයෙන් නව ලිබරල්වාදී සමාජ පරිවර්තන කෙරෙහි බලපෑම් කළේය. එහි ප්‍රතිඵලය වූයේ පවුලේ කෘත්‍යයන් ක්‍රමිකව ආයතනගත වගකීම් ලෙස විතැන් කර වැඩ ලෝකයේ තරුණ ශ්‍රම බලකාය පුළුල් කිරීමයි. සමාජානුයෝජනය, ආර්ථික සහයෝගීතාව වැනි අවශ්‍යතා නිල වශයෙන් පවුලෙන් දුරස් කෙරිණි. ඇතැම් විට සංස්කෘතික සමාජවලද ජීවවිද්‍යාත්මක අවශ්‍යතා පවා නොනිල වශයෙන් පවුල් සංස්ථාවෙන් පරිබාහිරව ඉටු කර ගන්නා තත්වයට පත් විය. ශ්‍රම විභජනය සහ ලිබරල් සමාජ ආකෘතිය සමග පවුලේ ව්‍යුහය කුඩා කිරීම අරමුණු කර ගත් නව ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක විය. එහි ප්‍රතිඵලය වූයේ පවුලේ න්‍යෂ්ටික ආකෘති සකස් වීමයි. බොහොමයක් විචාරකයින්ගේ මතය වන්නේ "ඒක විවාහය සහ න්‍යෂ්ටික පවුල් ගොඩනැගීම යනු මානව චර්යාවේ අරටුව" (හරාරි, 2021ඃ67) බවයි.

න්‍යෂ්ටික පවුල් ආකෘතිය විස්තෘත පවුලට සාපේක්ෂව සමාජගේ ගුණාත්මක සුබසිද්ධිය උදෙසා කළ බලපෑම සීමිතය. න්‍යෂ්ටික පවුල බිහි වීමෙන් සිංහල සමාජයේ පැවති පවුලේ විධිමත් ආකෘතිය වූ විවාහයේ ස්වරූපද වෙනස් විය. මුල් අවධියේ බහු භාර්යා, බහු පුරුෂ, බද්ධ විවාහය, එකගෙයි කෑම වැනි සංකල්ප පැවති බවට ඓතිහාසික මූලාශ්‍රයයවලින් අනාවරණය වෙයි (පීරිස්,2005, නොක්ස්, 2021). එම ක්‍රමවේද ඉවත් වී ඒක භාර්යා- ඒක පුරුෂ වශයෙන් විවාහ සංස්ථාව නියාමනය කෙරිණි. විශේෂයෙන් 1822 වර්ෂයේදී ප්‍රථම වරට විවාහය නීතිගත කිරීම සිදුවූයේද මේ යටතේ ය. න්‍යෂ්ටික ආකෘතියෙහි විවාහක යුවල සහ ඔවුන්ගේ දරුවන් පමණක් එක් නිවසක වාසය කිරීම සිදු විය. කාර්මික විප්ලවය මගින් යාන්ත්‍රීකරණය වූ සමාජ පරිස්ථිතිය තරගකාරී අවශ්‍යතා සහ ශ්‍රම බලකායක් වෙත සීඝ්‍රයෙන් ගමන් කිරීම මෙයට බලපෑ ප්‍රධාන හේතුවකි. ජීවින්ගේ මානව අවශ්‍යතා ද්විතියක තත්වයක ලා

සලකන පරිභෝජනවාදී ක්‍රමවේදයේ කාල්මාක්ස් පැවසූ ධනේශ්වරය බලයට ඒමත් සමග පවුලේ අනවරත බලාපොරොත්තු සහ සංකීර්ණතා ඇති විය.

නූතන න්‍යෂ්ටික පවුල ස්ථාපනය කාර්මික සමාජ අවශ්‍යතා කෙරෙහි පිටුබලයක් වුවද විවිධ අභියෝගයන්ට මිනිස් සමාජයට මුහුණ දීමට හේතුවක් වූ බව පෙනෙයි. විස්තෘත පවුලට සාපේක්ෂව න්‍යෂ්ටික පවුලේ ගණය සහ ගුණය අවම අගයක් ගන්නා බව විචාරක මතයයි. නිදහස් මතවාද සහ නව ලිබරල්වාදී සමාජ ප්‍රවේශය මගින් පවුලේ අගයයන් ද්විතික තත්වයක ලා සැලකීම මෙයට හේතුවයි. වර්තමානය සමාජ ප්‍රවනතා හමුවේ පවුලේ අරමුණු සහ කෘත්‍යයන්ගේ වෙනස්කම් ඇති වී තිබේ. පුද්ගලයාගේ ජීවන ශෛලිය යාන්ත්‍රිකකරණයත් වීමෙන් පවුලේ ව්‍යුහාත්මක වෙනස්කම්ද නිර්මාණය වී ඇත.

මානව පරිණාමයේ ඉතිහාසය අන්වේෂණය කළ යුවාල් නෝවා හරාරි දක්වන්නේ න්‍යෂ්ටික පවුල පිළිබඳ නූතන සංකල්පයේ පදනම වන ඒක ස්ත්‍රී- ඒක පුරුෂ විවාහයේ ස්වරූපය හේතුවෙන් ජෛවීය අවශ්‍යතා වාරණය කෙරෙන බවයි. "සදාකාලික ඒක විවාහය" පිළිබඳ ගුරු කුල අතර මත පදනම් වී ඇත්තේ දුබල සාධක මතය (හරාරි, 2021:68). ගුරු කුල මතය විවාදාපන්න වන්නේද මානවයාගේ ස්වරූපය සහ එම ආකෘතිය අතර ගැළපීමේ රික්තයක් පවතින හෙයිනි. එක් ස්ත්‍රියක් හෝ පුරුෂයෙකුගෙන් සිය කායික අවශ්‍යතා සංතෘප්ත කර ගැනීමට මිනිසාට නොහැකි බව ඓතිහාසික ලක්ෂණ ඔස්සේ මෙහි අවධාරණය කරයි. එහෙත්, මනසින් උසස් යන අර්ථය රැගත් මිනිසාගේ අසංතෘප්ත භාව ශිෂ්ට සම්පන්න මානව පරිණාමයේ වනචාරී බවින් මිදීමෙන් තහවුරු කරගත් අගනා තත්වයක් ලෙස සැලකිය යුත්තේ හුදෙක් සත්වයෙකු නොවී මිනිසෙකු වීම උදෙසාය. අවිධිමත් සහ අනාරක්ෂිත සමාජයක් වෙනුවට සපත්නිරෝෂයෙන් සහ වෛරී ආකල්ප රහිත මානව

පැවැත්මක් නිර්මාණයට කුටුම්භ සංරක්ෂණයේ විවාහ ආකෘතියට හැඩ ගැසීමට පෙරදිග සමාජයේ බොහෝ දෙනෙක් නැඹුරුව සිටිති. එහෙත් න්‍යෂ්ටික ඒකකයක සිදු වන නූතන බහුකාර්යතාව සමග එහි පැවතීමේ ධාරිතාව ඉක්මවා ගොස් ඇති බව නම් පැහැදිලිය.

න්‍යෂ්ටික පවුල් සංස්ථාව සමාජ, ආර්ථික, දේශපාලන ආදී තත්වයන්ටද බලපෑම් කරන්නකි."රාජ්‍ය බලය පියාගෙන් පුතාට උරුම වීම, පවුලේ සාමාජිකයන් කෙරෙහි එකිනෙකා කෙරෙහි දැඩි අයිතියක් පල කිරීමද න්‍යෂ්ටික පවුල් ආකෘතියේ ඵලයකි" (හරාරි, 2021:67). නූතන සමාජයේ ප්‍රබල අභියෝගයක් වී ඇති පෞද්ගලිකකරණයද මෙහි අතුරුඵලයකි. පෞද්ගලික අයිතිය ලිබරල් න්‍යායට පක්ෂපාතී වුවද මානව පැවැත්මට අභියෝග කරන තත්ව මෙරටද දෘශ්‍යමානය.

වර්තමානයේ න්‍යෂ්ටික පවුල මුහුණ දෙන සමාජ ආර්ථික දේශපාලන සංස්කෘතික අධ්‍යාපන සෞඛ්‍ය වැනි ක්ෂේත්‍ර රාශියක පැතිරුණු ගැටළු රාශියකි. මානව සබඳතා හුදෙක් උපකරණීය තත්තවයට (අමරකීර්ති, 2017) පත් වීමට එම අභියෝගද හේතු වී ඇත. විසිවන සියවසේ මෙරට ඇති වූ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය සමග සමාජයේ අධෝ ව්‍යුහය ලෙස කාල්මාක්ස් දැක්වූ ආර්ථිකයේ ප්‍රබල බලපෑම්වලට න්‍යෂ්ටික පවුල ලක් වී තබේ. පවුල් සංස්ථාව සංකීර්ණ වීමෙන් කෘත්‍යයන් විසරණය විය. ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව වෘත්තීන්හි නියැලීමට සිදු වීම, මව්වරු විදේශගත වීම, කාර්යබහුල ජීවන රටාව හේතුවෙන් දෙමව්පිය දූදරු ස්වාමි භාර්යා සබඳතා දුරස් වීම, අනාරක්ෂිත බව, විවාහ සබඳතා පලුදු වීම වැනි උග්‍ර සමාජ ගැටලු ඇති වී තිබේ. දරුවන් සමාජානුයෝජනය කිරීම, සමාජ සුරක්ෂිතතාව තහවුරු කිරීම වැනි ගැටලු රාශියකට පොදුවේ සමාජයක් ලෙස මුහුණ දෙමින් සිටියි.

**න්‍යෂ්ටික පවුලක පවතින මානව සබඳතා**

මානව සබඳතාවල පෘථුල සහ ප්‍රාරම්භක අවස්ථාව පවුල් සංස්ථාව ලෙස සැලකිය හැකිය. සමාජානුයෝජනයේ ප්‍රමුඛ කාර්යය ද හිමි ආයතනය වශයෙන් පවුල සබඳතා නිර්මාණය කිරීම සහ පවත්වා ගැනීමේ විශේෂඥතාව සහිත ආයතනයයි. වයස් භේදයකින් තොරව සමාජ සම්මතය අනුව සබඳතා ගොඩනැංවීමට එහි අවකාශය විවර වෙයි. භාව මූලික සබඳතා පද්ධතියක එකතුවක් වන පවුල් සංස්ථාවේ නියෝජිතයන් වන්නේ ද එකී පුද්ගලයන් ය. අතීත පවුලෙහි සහ නූතන න්‍යෂ්ටික පවුලෙහි මානව සබඳතා අතර පවතින්නේ විවිධත්වයකි. පවුලේ ස්වරූපය මෙන්ම සබඳතා රටාවේ ද විශේෂතා කාලානුරූපීව ඇති වී තිබේ.

මූලික පවුලෙහි ප්‍රභව අවස්ථාව වන විවාහය පදනම්ව එක් වන පුරුෂයා සහ ස්ත්‍රිය ස්වාමියා සහ භාර්යාව වශයෙන් ප්‍රථමයෙන් බැඳීම් ඇති කර ගනියි. පවුලේ අරමුණු පෙළ ගැසීම ආරම්භ වන්නේ ඒ සමගය. පසුව විස්තෘත පවුලකදී විවාහක යුවල සහ ඥාතීන් අතර කුටුම්භ සබඳතා නිර්මාණය වෙයි. මූලික පවුලක ඥාති සබඳතා අවශේෂ වශයෙන් පවුලෙන් පරිබාහිරව ක්‍රියාත්මක වෙයි. මව්පියන් සහ දූ දරුවන් අතර රුධිරමය සබඳතා ඇති වීම පවුලේ මානව සබඳතා වඩාත් හරයාත්මක තත්වයට පත් කිරීමට සමත්ය. දරුවන් සහ මව අතර ද, දරුවන් සහ පියා අතර ද වශයෙන් මෙම සබඳතාවය වර්ග කළ හැකි ය. ජීව විද්‍යාත්මක ව මව සහ පුතුන් අතර ගොඩ නැගෙන සබඳතාව සහ පියා සහ දූවරු අතර සබඳතාව වශයෙන් විරුද්ධ පාර්ශව අතර සබඳතා වඩාත් සමීප බව පෞරුෂ වර්ධනය සහ මානව සංවර්ධන අවධි පිළිබඳ දක්වන සිග්මන් ෆ්‍රොයිඩ් සඳහන් කරයි (රාමණායක, 2001). එය ජීවවිද්‍යාත්මක ස්වභාවයකි. දරුවන් දරුවන් අතර සහෝදර සබඳතා නිර්මාණය වෙයි. මූලික පවුලක ගොඩ නැගෙන මෙම මානව සබඳතා

පවුල තුළ පමණක් නො ව ඉන් පිටත පොදු සමාජය කෙරෙහි ද බලපෑම් කරයි.

පවුලේ කෘත්‍යයක් වන සමාජානුයෝජනයය පවුල් පරිස්ථිතයෙහි පවත්වන බන්ධුත්ව උපකෘතය. පවුල් සංස්ථාවක පවත්වන මානව සබඳතා භාවමය සහ කෘත්‍යමය වශයෙන් බැඳෙයි. සමාජ විද්‍යාවේ තත්වය සහ කාර්ය කොටස් වශයෙන් දක්වන මෙම බන්ධුත්වය සංස්කෘතිය අනුව යුතුකම් සහ වගකීම් ලෙස අර්ථකථනය කරයි. සමාජයේ මනා පැවැත්ම තහවුරු කිරීමේ අරමුණින් ක්ෂුද්‍රම සමාජ ඒකකය විධිමත් සහ සහයෝගී සබඳතා ගොඩනැගීම වැදගත්ය.

දරුවා සහ දෙමව්පියන් අතර සබඳතාව නිර්මාණය වන්නේ කළල අවධියේ සිට ම ය. මව සමග කායික වශයෙන් පවතින බැඳීම සහ මව-පියා දෙදෙනා ම සමග ගොඩනැගෙන ජීවවිද්‍යාත්මක සහ මනෝවිද්‍යාත්මක සබඳතාවක් එහි පවතියි. දරුවා සමාජානුයෝජනය කිරීමේ ප්‍රමුඛ ම වගකීම දෙමව්පියන්ට පැවරෙයි. එයින් මව කෙරෙහි පවතින වගකීම ප්‍රබලය. දෙමව්පිය සබඳතාවය ළදරුවාගේ වර්ධනය, පරිණතිය, සමාජ චර්යාව, ලිංගික භූමිකා, ප්‍රජානන සංවර්ධනය යන සෑම අවධියක දී ම අත්‍යවශ්‍ය ය.

ළදරුවාගේ පරිසරයේ වැදගත්ම පුද්ගලයන් වන්නේ මව හා පියා යි. එබැවැන් මාපියන් හා ගත කරන ගුණාත්මක කාලය දරුවන්ගේ සමාජ ජීවිතයට මහෝපකාරී වෙයි. ... දරුවන් හා දෙමාපියන් අත ඇති වන යහපත් චිත්තවේගී බැඳීම (Attachment) ප්‍රධාන වශයෙන් ළදරුවාට කෑම්- බීම් දීම මත නො ව ඔහු කෙරෙහි දක්වන දයාව හා උණුසුම පදනම්කොට පවති යි(රාමණායක, 2001:132).

බුදු දහමෙහි සිඟාලෝවාද සූත්‍රය දෙමව්පියන් සහ දරුවන් අතර සිදු වන යුතුකම් සහ වගකීම් පිළිබඳ ව ද දක්වා ඇත. දෙමාපියන් විසින්

දරුවන්ට ඉටු කළ යුතු යුතුකම් ලෙස, දරුවන් පාප ක්‍රියාවලින් මුදවා ගැනීම, දරුවන් යහපත් ක්‍රියාවල යෙදවීම, දරුවන්ට හොඳින් ඉගැන්වීම, සුදුසු කල ආවාහ විවාහ කර දීම, සුදුසු කල දායාද පවරා දීම යන යුතුකම් ද, දරුවා විසින් දෙමව්පියන් වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් වශයෙන්, මවුපියන් පෝෂණය කිරීම, මව්පියන්ගේ සියලු කටයුතු කරදීම, මවුපියන්ගේ සිරිත් විරිත් සහ කුලපරපුර රැක ගැනීම, මව්පියන් මියගිය පසු ව පින් අනුමෝදන කිරීම ගැන දීඝ නිකාය 2-3 හි දක්වා තිබේ.

වර්තමානය වන විට දෙමව්පියන් සහ දරුවන් සබඳතා හුදෙක් පෝෂණය, කායික රැකවරණය වැනි තත්වවලට සීමා වී තිබේ. ස්ත්‍රී-පුරුෂ භේදයකින් තොර ව වෘත්තීය තත්ව මත පැවතීමට සිදු වීම දරුවන් දිවා සුරැකුම් මධ්‍යස්ථාන වැනි ආයතනගත හෝ බාහිර පුද්ගල ඇසුරක රැකවරණයට තබා යාමට සිදු වී තිබේ. දරුවන් සමග දෙමව්පියන්ගේ සබඳතා ඉතාමත් පටු සීමාවක රැඳුණකි. රට තුළ ඇති ජීවන අර්බුද විසඳා ගැනීමට සඳහා මානව ශ්‍රමයට ඇති වූ අධික ඉල්ලුම සමග ශ්‍රම සංක්‍රමණ සීඝ්‍රයෙන් ඉහළ ගියේ ය. එයින් සිදු වූයේ පවුල් සංස්ථාවේ මානව සබඳතා දුරස් වීම හෝ අහිමි වීම යි.

විශේෂයෙන් මව විදේශගත වීම දරුවන් කෙරෙහි නිශේධාත්මක බලපෑම් ඇති කිරීමට හේතු විය. දරුවන්ගේ ආරක්ෂාව, සෞඛ්‍ය නිසි අවධානයට ලක් නො වීමෙන් ළමා අපචාර, ලිංගික අතවර වැනි තත්ව සමාජයේ සුලබ විය. සමාජ අනාරක්ෂිත බව සහ අවිධිමත් බවක් ඉන් ඇති විය. බිඳුණු පවුල් නැතහොත් දෙමාපියන්ගේ රැකවරණය ආරක්ෂාව අහිමි වූ පවුල් සංඛ්‍යාව ද ක්‍රමක්‍රමයෙන් වර්ධනය වීමට මෙම තත්වය බලපා තිබේ (දැඩිගමුව, 2012).

වර්තමාන සමාජ ප්‍රවනතා හමුවේ න්‍යෂ්ටික පවුල අභියෝගයට ලක් වූවා සේ ම, පවුලේ සබඳතාවල හරයාත්මක බවද ප්‍රහීන විය. සමාජ

විද්‍යාත්මක නිර්ණ අනුව නූතන පවුල් සංස්ථාවෙහි පාර්සන්ස්, මර්ඩොක් සඳහන් කළ මානව අවශ්‍යතා නිසි අයුරින් සාධනය නොවීම මෙයට හේතුවයි.

1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තිය සමග ධනේශ්වරය නැගී සිටීමෙන් මෙරට පංති විෂමතාව තදබල ලෙස නිර්මාණය විය. කුලය වැනි සමාජ විෂමතා වෙනුවට මතු වූ නව තත්වය මානව පැවැත්ම කෙරෙහි ගැටලුකාරී විය. පුද්ගලිකවාදය විසඳුමක් ලෙස හඳුන්වාදීමෙන් සියල්ල වෙළඳපළකරණය වීම නො නවත්වා සිදුවිය. ආර්ථික සහයෝගීතාව පවත්වා ගැනීමේ අරමුණින් නිදහස් වෙළඳපල ආර්ථිකය විසින් මෙහෙයවන ලාංකීය සමාජය අනවරත ප්‍රෝත්සාහයක නිරත වෙයි. ජීවන තත්වය ගොඩනංවා ගැනීමට වෘත්තීන් සහ ව්‍යාපාර වෙත දැඩි ව නැඹුරු වීමෙන් පොදු වාසය අත්හිටුවන ලද අවශ්‍යතාවක් බවට පත් විය. මානව ධර්මතා, සමාජානුයෝජනය දෙවන පරපුරේ ඌණ වූ අවශ්‍යතා බවට පත් වී තිබේ. පවුල් ව්‍යුහයන් සතු ව පැවති ආර්ථික සහයෝගීතාව පිළිබඳ ලීච් පුල්එළිය කෘතියේ දී දක්වන්නේ අතීත ලංකා සමාජයේ ශ්‍රම සහයෝගීතාවය උදෙසා කයිය නම් ක්‍රමවේදයක් පැවති බවයි.

නිදහස් සමාජ ක්‍රමයේ නිදහස් මතධාරීන් විසින් පවුල ප්‍රතික්ෂේප කරනු ලැබීමෙන් පවුලේ මූලික කාර්යයක් වන ලිංගිකත්වයද අවම සාධකයක් ලෙස සීමා රහිත වී තිබේ. ස්ත්‍රී- පුරුෂ භේදයකින් තොරව අත්විඳින සමාජ පීඩනය සහ කාර්යබහුලත්වයද පොදු වාසය පාලනය වීමද මෙයට හේතුවකි.

පුරාණ කොමියුන න්‍යාය පිළිබඳ යෝජකයන් තර්ක කරන ආකාරයට නූතන විවාහවල ලක්ෂණයක් බවට පත් වී ඇති බහු අනියම් සබඳතා සහ ඉහළ දික්කසාද අනුපාත පමණක් නොව, ළමයින් සහ

වැඩිහිටියන් යන දෙපිරිසම පෙළෙන විශාල ප්‍රමාණයක මානසික සංකූලතා යන මේ සියල්ල ඇති වී තිබෙන්නේ අපගේ ජීව විද්‍යාත්මක සැකැස්මට නොගැලපෙන ආකාරයේ න්‍යෂ්ටික පවුල් සහ ඒක විවාහක සම්බන්ධකම් තුළ ජීවත් වීමට මානවයන්ට බල කෙරී ඇති හෙයිනි (හරාරි, 2021ː67).

ගැටලු තනි ව විසඳා ගැනීමට සිදු වීම සහ පුද්ගලයා බලාපොරොත්තු වන සාමූහිකත්වය අහිමි වීම මෙයට හේතු වී ඇත. සමාජ යාන්ත්‍රිකකරණය, පුද්ගල වාදය, නාගරීකරණය, ධනවාදය වැනි සමාජ විපරිනාම සියල්ල ම සමාජයේ පවුල් සංස්ථාවේ ස්ථාවරත්වය අභියෝගයට ලක් කරයි. පොදු වාසය මෙන්ම, ලිංගික අවශ්‍යතා, සමාජානුයෝජනය වැනි තත්වය හුදෙක් වාණිජමය අත්පත් කර ගැනීම්වලට සීමා විය. නාගරීකරණය සහ පරිභෝජනවාදී සංස්කෘතිය මානව සබඳතාවල ගුණාත්මක බව වෙනුවට වාස්තවික තත්ව මත පදනම් වීම සිදු විය.

විසිවන සියවසේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය සමඟ සමාජයේ අධෝ ව්‍යුහය ලෙස ආර්ථිකය ප්‍රබල තත්වයට පත් විය. පවුලෙහි මූලික අවශ්‍යතා සංකීර්ණ වී පවුල් සංස්ථාවෙහි කාර්යමය විස්තෘතියක් ඇති විය. ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව වෘත්තීන්හි නියැලීමට සිදු වීම, මව්වරු විදේශගත වීම, කාර්යබහුල ජීවන රටාව හේතුවෙන් මව්පිය- දූ-දරු සබඳතා දුරස් වීම මත අනාරක්ෂිත බවක් නිර්මාණය වීම, විවාහ සබඳතා පලුදු වීම වැනි ගැටලු රාශියක් සමාජයේ ඇති වී තිබේ. දරුවන් සමාජානුයෝජනය කිරීම, සමාජ සුරක්ෂිතතාව තහවුරු කිරීම වැනි ගැටලු රාශියකට ද සමාජයක් වශයෙන් මුහුණ දෙමින් සිටියි.

මෙම ලිපියෙහි දෙවනුව පර්යේෂණ ක්‍රමවේදය සහ  නියැදිය ද, තෙවනුව අධ්‍යයනයේ සාකච්ඡාව යටතේ ගීතයෙන් ප්‍රතිනිර්මිත මාතෘ

භූමිකාවෙහි සාම්ප්‍රදායික ස්වරූපය, අද්‍යතන ස්වරූපය සහ නූතන සමාජයේ මාතෘ භූමිකාවත්, සිව්වනුව එයට හේතු වූ සාධකත්, පස්වන කොටසෙහි අධ්‍යයනයේ සමාලෝචනය සහ නිර්දේශත් අන්තර්ගත වෙයි.

**සාහිත්‍ය විමර්ශනය**

සිංහල ගීත සාහිත්‍යය පිළිබඳ පුරෝගාමී අත්හදා බැලීම් සහ න්‍යායාත්මක අවකාශ සලසමින්, ඓතිහාසික තොරතුරු අධ්‍යයනයන් සිදුකළ සුනිල් ආරියරත්නයන්ගේ 'ග්‍රැමෆෝන් ගී යුගය' (2017) ග්‍රන්ථයෙහි ගීතයේ විකාශනයේ සුවිශේෂ හැරවුම් ලක්ෂ්‍ය වූ ග්‍රැමෆෝනයේ ආගමනය, එහි විකාශනය සහ එකල ගීතයේ සිදු වූ ව්‍යුහාත්මක වෙනස්කම්, ග්‍රැමෆෝන් ගීතයේ දුර්වලතා ආදිය පිළිබඳ පර්යේෂණාත්මක විග්‍රහයක් අන්තර්ගත වී ඇත. සිංහල ගීතයේ මූලාරම්භය, පවුල පිළිබඳ ලියවුණු ගීතයේ භාෂාව සහ ගී පද රචනය කෙරෙහි සංගීතයේ බලපෑම පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ඉවහල් විය. 'කැරොල් පසම් කන්තාරු' (1987) කෘති ද මෙම අධ්‍යයනය දිශාගත විය යුතු ආකාරය මෙන්ම, ඓතිහාසික කරුණු විග්‍රහ කර ගැනීමට උපකාර විය.

ගීතයේ ප්‍රභවය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි ප්‍රමුඛ අවශ්‍යතාවක් නොවූව ද ගීතයේ වස්තු විෂයාත්මක විකාශනය සහ එයට බලපෑ හේතු අධ්‍යයනය තුළින් නූතන ගී පද රචනයේ සාධනීය සහ නිෂේධනීය භාෂා භාවිතයන් සංසන්දනාත්මක ව අධ්‍යයනයට අවශ්‍ය පරිඥානය ලබා ගැනීමේ අවශ්‍යතාව පූරණය කරයි.

ලියනගේ අමරකීර්තිගේ 'පහන සහ කැඩපත' (2010) කෘතිය නවකතාව, කෙටිකතාව, ගීතය වැනි නූතන සාහිත්‍යයාංග කිහිපයක් පිළිබඳ න්‍යායික සහ තුලනාත්මක විග්‍රහයක් ද, පඨිතය ඔස්සේ සිදු කරන

සාහිත්‍යයමය කියවීම ද, කේමදාස සංගීතයේ ශිෂ්ටාචාරමය කාර්යභාරය විග්‍රහ කරමින් සංගීත රචනය සහ ගී පද රචනයේ විශේෂතාව විග්‍රහ කිරීම සහ ජනප්‍රියත්වය හේතුවෙන් ගීතයේ ගුණාත්මක බව අභියෝගයට ලක් වන ආකාරය පිළිබඳ කේමදාස සංගීතය ඇසුරින් සිදු කරන විග්‍රහය ද නිර්දිශ්ට නිබන්ධයේ ගීතයේ සාධනීය සහ නිෂේධනීය ලක්ෂණ තුලනාත්මක ව විමර්ශනයෙහි ලා උපකෘත විය.

ඔහුගේම ‘නව කවි සලකුණ’ (2017) කෘතිය කවිය සහ ගීතය අතර ඇති වෙනස විග්‍රහ කරගැනීමටත්, නූතන මානව සබඳතාවල ඇති යාන්ත්‍රික බව විග්‍රහ කරන සාහිත්‍යයේ ස්වරූපය න්‍යායාත්මක ව විමර්ශනය උදෙසා උපකල්පන ගොඩනගා ගැනීමටත් මග පෙන්වීම් සිදු කරන්නකි. ගීතය කවියේ දිගුවක් ය යන මතවාදය මෙන් ම, සෑම ගීතයක් තුළ ම කවියක් තිබේ ය, යන රත්න ශ්‍රී විජේසිංහයන්ගේ අදහස ද මත කවිය ආශ්‍රිත සක්‍රීය රසිකත්වය, කවියේ භාෂාව සහ නූතන සමාජ සන්දර්භය තුළ කවියේ සෞන්දර්යාලෝකය සහ මහජන තර්කනය පිළිබඳ සිදු කරන න්‍යායික සහ නූතන කවිය ඇසුරෙන් කෙරෙන සනිදර්ශනාත්මක විමර්ශනය ගීතය විචාරාත්මක අධ්‍යයනය උදෙසා මාර්ගෝපදේශකත්ව සපය යි.

කවිය සහ ගීත රසවින්දනය පිළිබඳ දුරවබෝධ සාහිත්‍යමය අධ්‍යයනයක් ලෙස සරත් විජේසූරියගේ ‘කවිකම් මනරම්’ (2019) කෘතියෙහි සන්දර්භය තුළ “අද ලියවෙන කවියක් නැත” යන විවේචනය සමස්ත නිර්මාණාවලිය කෙරෙහි යොමු කිරීම සැහැසි ය යන්න දක්වමින් නිර්මාණාත්මක කාව්‍ය අගයමින් කාව්‍ය රසවින්දනයෙහි ලා වැදගත් වන මූලික සිද්ධාන්ත පිළිබඳ සිදු කරන විවරණය සහ කවිය ඇසුරෙන් නිර්මිත ගීතය පිළිබඳ කෙරෙන සෞන්දර්යාත්මක විවරණ ප්‍රස්තුත නිබන්ධයේ නිර්මාණකරුවන්ගේ ගීත ද විග්‍රහයට හසුකරගත්තක් හෙයින්

පූර්ව අධ්‍යයනයක් ලෙස පර්යේෂණයේ දී නිර්මාණ විචාරය සඳහා න්‍යායාත්මක ශික්ෂණය කෙරෙහි වැඩි නැඹුරුතාවකින් සමන්විත වූවකි.

කවිය සිංදු සහ ගී වැනි විවිධ පද්‍යමය නිර්මාණයන්ගෙන් වෙන් වූ සාහිත්‍යාංගයක් ලෙස ගීතයේ අනන්‍යතාව වෙන් කර හඳුනා ගැනීමේ දී, පර්යාය නාම අර්ථ විවරණය උදෙසා 2015 වර්ෂයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ සැසිය සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකාවක් ආශ්‍රයෙන් සකස් කරන ලද මනෝරි මනම්පේරිගේ සින්දු විමසුම' (2017) අධ්‍යයනයට ලක් කර ඇති මෙරට කලාංගයන්ගේ විකාශනය කෙරෙහි බලපෑම් කළ ආක්‍රමණ සංක්‍රමණ සහ සංස්කෘතික සංස්පර්ෂ ඇසුරින් කාව්‍ය ක්ෂේත්‍රයේ සිදු වූ විපරිනාම ද, ගීතය හැඳින්වීමේ දී යොදා ගන්නා සිංදු යන්නෙහි ප්‍රභවය ප්‍රශස්ති ගායනාවන්හි වන ගායනා විශේෂයක් හැඳින්වීම සඳහා යොදාගන්නා ලද්දක් බව ද, නර්තනය සහ දෙමළ භාෂාව ඇසුරින් ලබා ගත් දත්ත විශ්ලේෂණය කරමින් සිදු කරන නිරවුල් ව ගීතය යන්න විග්‍රහ කිරීමෙහි ලා උපයුක්ත විය.

සිංහල ගීතය, සංස්කෘතික නිරූපණයක් ලෙස ක්‍රියාකළ ආකාරය සහ ගීතයේ වෙනත් ශානරයක් ලෙස එය අධ්‍යයනය කළ ආකාරය පරිශීලනයෙන් ප්‍රස්තුත අධ්‍යයනය සිදුකළ යුතු ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට පාතේගම ඥාණිස්සර හිමිගේ 'සිංහල ගීතය සහ අපේ සංස්කෘතිය' (2015) කෘතිය ද, ගීත පද රචනය ගීතයක සිදු කරන කාර්ය භාරයේ උත්කෘෂ්ටතාව අධ්‍යයනය උදෙසා සංගීතය සහ පද රචනය පිළිබඳ සංක්ෂිප්ත අවබෝධයක් වෙනුවෙන් ගීතය සහ එහි සංගීතය පිළිබඳ විස්තර කරන මඩවල එස්. රත්නායකගේ 'ගී සිංදු සාහිත්‍යය' (2017) කෘතිය ද වැදගත් විය.

මෙම අධ්‍යයනය භාෂා සාහිත්‍යය කේන්ද්‍ර කරගනිමින් සිදු වුව ද, ගීත පද රචනා නිර්මාණය සහ ඒවාට වස්තු විෂය වූ පවුල් සංස්ථාවේ විකාශනය, පවුල් සංස්ථාවක් තුළ වන මානව සබඳතා අධ්‍යයනයට අවශ්‍ය සමාජ, ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික සාධක පිළිබඳ සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන් අධ්‍යයනය කිරීමට අවශ්‍ය වූ හෙයින් සමාජ විද්‍යා මූලාශ්‍ය සහ ඓතිහාසික මූලාශ්‍රය ද අධ්‍යයනය කිරීම අවශ්‍ය බව ආරම්භයේ සිට ම හැඟිණි.

මෙහිලා භාවිත සමාජ විද්‍යා මූලාශ්‍ර අතර සාහිත්‍යය සහ සමාජය අතර ඇති අවියෝජනීය බැඳීම, සාහිත්‍යයෙන් සමාජය යථාර්ථවාදී ලෙස නිරූපණය කරන ආකාරය සහ නූතන සමාජ අර්බුද සාහිත්‍යය තුළින් නිරූපණය කළ යුතු අකාරය සහ සමාජීය සාහිත්‍ය අධ්‍යයන ප්‍රවේශයේ ආරම්භය වැනි තොරතුරු අන්තර්ගත 'සාහිත්‍යය සමාජ විද්‍යාව' (2016) කෘතිය, සාහිත්‍යය සහ සමාජය අතර අන්‍යොන්‍ය බැඳීම ඇසුරින් ගීතය විග්‍රහ කිරීම සඳහා න්‍යායාත්මක ප්‍රවේශ පිළිබඳ අවබෝධය ලැබීමට මූලික වශයෙන් වැදගත් වෙයි. පවුල නිර්වචනය සහ පවුලේ කෘත්‍යාත්මක වෙනස් වීම් පිළිබඳ නිලූකා විජේබණ්ඩාර විසින් ලියන ලද නූතන ශ්‍රී ලංකා සමාජය තුළ පවුලේ කෘත්‍යයන් හා මානව සම්බන්ධතා රටාවන්ගේ වෙනස්වීම් පිළිබඳ විශ්ලේෂණයක් ලිපිය සමාජ විද්‍යාත්මක ව පවුල නිර්වචනය, පවුලේ කාර්යභාරය සහ කාලානුරූපී ව සිදු වූ සමාජ විකාශනය සමග ප්‍රකට කළ නව්‍ය ස්වරූප ද නූතන පවුල පිළිබඳ ශාස්ත්‍රීය තොරතුරු සඳහා වැදගත් වූ පර්යේෂණ පත්‍රිකාවකි.

සමාජයේ කේන්ද්‍රීය සංස්ථාවක් වන පවුල පිළිබඳ ඓතිහාසික පසුබිම හා ලාංකේය සමාජ පසුබිම පිළිබඳ අධ්‍යයනයේ දී ඇම්. බී. ආරියපාලගේ 'මධ්‍යකාලීන ලංකා සමාජය' (2014) 13 වන සියවස වැනි අතීතයක මෙරට සමාජ, දේශපාලන, ආර්ථික තොරතුරු විග්‍රහ

කරන්නකි. මවගේ භූමිකාව පිළිබඳ ඉන් අවබෝධයක් ලබා ගත හැකි විය. එයින් මෙරට ගෘහස්ත ජීවිතය, විවාහය, විස්තෘත පවුල් පසුබිම සම්බන්ධ තොරතුරු ලබා ගත හැකි ය. පුරාණ ලාංකේය සමාජයේ ඇඳුම් පැළඳුම්, ආගම ධර්මය, භාෂාව, කෑම බීම, වෘත්තීන් වැනි විවිධ ක්ෂේත්‍ර අධ්‍යයනය කරමින් රචනා කර ඇති රොබට් නොක්ස්ගේ එදා හෙළ දිව ඩේවිඩ් කරුණාරත්න පරිවර්තනය (2021) පුරාණ සමාජ ක්‍රමය ක්‍රමයෙන් විවෘත ආර්ථික ප්‍රතිපත්තියක් ලෙස සකස් වීම තෙක් ගමන් මාර්ගය සහ ඉන් සිදු වූ සමාජ චලයතා සහ මාතෘ භූමිකාව පිළිබඳ සංසන්දනාත්මක ව විශ්ලේෂණයට සුලබ ව භාවිතයට ගනු ලබන මූලාශ්‍රයකි.

**ක්‍රමවේදය සහ නියැදිය**

ගීතයේ ප්‍රාරම්භක අවධියේ සිට ම කේන්ද්‍රීය සමාජ සංස්ථාව වන පවුලෙහි පවතින මාතෘ භූමිකාව වස්තු විෂය ලෙස යොදා ගෙන ඇති බව පැහැදිලිය. එම සියලු ගීත රචකයින් මෙහි සාකච්ඡා කිරීම දුෂ්කර කර්තව්‍යයකි. එහෙයින් අවධීන් කිහිපයකට අයත්, ගම සහ නගරයද, වෘත්තීය විවිධත්වයද, ස්ත්‍රී- පුරුෂ වශයෙන්ද නියෝජනය වන පරිදි ගීත යමුනා මාලිනි පෙරේරා, සුනිල් සරත් පෙරේරා, රත්න ශ්‍රී විජේසිංහ යන රචකයින් තිදෙනා නියැදිය වශයෙන් තෝරාගෙන තිබේ.

**සාකච්ඡාව**

**මාතෘ භූමිකාවෙහි සමාජයීය ආනුභවිකත්වය සහ අගනාකම්**

මෙම තත්ව සාම්ප්‍රදායික මාතෘ භූමිකාවේ දැකිය හැකි සහ මාතෘ භූමිකාව මගින් අපේක්ෂිත චර්යාව යි. එය අද්‍යතනයේ පූර්ණ වශයෙන් දැකීම අපහසු ය. දරුවා මෙලොවට බිහි වීමටත් පෙර කළල අවධියේ දී ම ගොඩ නැගෙන මව්- දරු සබඳතාවය දරුවාගේ අභාෂක ලෝකයේ සංවේදන වටහා ගැනීමට තරම් සියුම් වූවකි. සිග්මන් ෆ්‍රොයිඩ් දක්වන පරිදි මානවයාගේ පැවැත්මේ සහ සංවර්ධනයේ සුවිශේෂ කායික

මානසික සබඳතාවක් නිර්මාණය වන්නේ මව සමඟ ය (රාමණායක,2006). මානව දරුවෙකු බහ තෝරන වියේ දී පළමුව උච්චාරණය කරන්නේ ද 'අම්මා' යන පදය යි. ඇගේ ජීවවිද්‍යාත්මක අනන්‍යතා ද, මානසික සංවේදීතාව ද මිනිසාගේ ආරම්භක සංවේදන කෙරෙහි බලපෑම් කරයි. පූර්ව ප්‍රසව අවධියේ සිට ම මව සමග පවතින සබඳතාව දරුවාගේ පැවැත්මට උපකාරයක් වන බව මනෝවිද්‍යාත්මක මෙන් ම ජීවවිද්‍යාත්මක අනාවරණයකි (පෙරේරා,2002). ගීත රචකයා මෙම කරුණු පිළිබඳ සංවේදී වෙමින් ද, විචාරශීලී වෙමින් ද ගීත නිර්මාණය කර ඇත. මව දරුවා විෂයෙහි දක්වන ආදරය, සිදු කරන පරිත්‍යාග සහ සුරක්ෂිත කරන රැකවරණය වැනි මාතෘත්වයේ බහු විධ මාන ගීත මගින් හෙළි කරයි.

ජාතක කථා පොතෙහි සෝනන්ද ජාතකයෙහි මවගේ වගකීම ප්‍රකට වන වචන සතරක් දක්වයි. ඒ අනුව, දරුවා කෙරෙහි පළමුවෙන් ම ආදරය දක්වන්නී හෙයින් අම්මා ලෙස හඳුන්වයි. කාන්තාවක තුළ ප්‍රථම ආදරය හට ගන්නේ ඇය පිළිසිඳගෙන දොළදුක ඇති වීමත් සමග ය. ඇය දරුවා බිහි කරන හෙයින් ජනෙත්ති නමින් ද, දරුවා සතුටු කරන හෙයින් තෝසෙන්ති නමින් ද, දරුවාට කිරි ලබා දී නිසි කායික පෝෂණය ඇති කරන හෙයින් පෝසෙන්ති නමින් ද හැඳින් වේ. මව සහ දරුවෙකු අතර ගොඩනැගෙන සබඳතාවයෙහි සංකීර්ණත්වය ඉන් පැහැදිලි ය (උඩුවාහර, 2013).

මව සහ පියා අතර ජීවවිද්‍යාත්මක ව ගොඩනැගෙන සබඳතාවේ ප්‍රතිඵලයක් වශයෙන් දරුවෙකු බිහි වෙයි. මව සහ දරුවා අතර පළමු සබඳතාව නිර්මාණය කරන දරු කළලයක් පිහිටීම ස්ත්‍රියක කෙරෙහි ජීවවිද්‍යාත්මක ව අනන්‍ය වූ ශක්‍යතාවකි. ගීතයට පමණක් සීමා නොවනතථ්‍ය ලෝකයේ දී ද දර්ශනය වන ගැබිණි මවකගේ කැපවීමෙහි

දර්ශන මාත්‍රයක් 'මිණි බැඳි දොර' ගේය පද සංග්‍රහයෙහි ඇතුළත් පහත ගීතයෙන් රත්න ශ්‍රී විජේසිංහ ප්‍රතිනිර්මාණය කරයි.

මහරහත් ගමනින් යනෙන
දරු බර දරා කුසිනේ
පරපුරක අමරස පුරා
ළැම කිරි බරිනි නැමුනේ (විජේසිංහ, 2018)

දරුවෙකු පිළිසිඳ ගැනීම කායික මෙන්ම මානසික වශයෙන් ද ස්ත්‍රියකට විශේෂ අවස්ථාවකි. ඇය වෙනුවෙන් සිංහල සිරිත්විරිත් අනුව දොළදුක, ගබපෙරහර, අංගුලිමාල පිරිත වැනි විශේෂ සංස්කෘතිකමය පිළිවෙත් සමුච්ඡයක් පවති යි (ආරියපාල, 2014). සමාජයෙන් ඇයට විශේෂ අවධානයක් සහ ගෞරවයක් ලැබෙයි. වෛද්‍ය විද්‍යාත්මක ව පූර්ව ප්‍රසව අවධිය නමින් හඳුන්වන මෙම අවධියේ දී කායික සහ මානසික වශයෙන් මවක තුළ සිදු වන වෙනස්කම් සමුදායක් දක්වයි. ගෙදර බුදුන් ලෙස වන්දනා කරන මාතෘත්වය වෙනුවෙන් ඇය කායික ව මෙන්ම, මානසික ව ද සූදානම් වෙයි. දරු කළලයක් පිහිටි පසු ඇයගේ ආහාර පාන, ගමන් විලාසය තමන් වෙනුවෙන් නො ව දරුවාගේ සෞඛ්‍ය වෙනුවෙන් හැඩගස්වා ගනි යි. මවක විෂයෙහි පවතින පූජනීයත්වය "මහරහත් ගමනින්" ප්‍රතියමාන කරයි.

ස්ත්‍රියගේ ශරීරයේ කායික වශයෙන් වන අංගලක්ෂණ ඇයගේ සුන්දරත්වයට පමණක් නො ව මානව පරපුරේ පැවැත්ම වෙනුවෙන් සිදු වූ පිහිටීම් ය. පුත් කුමරු මවගෙන් කිරි බොනු දකින සිදුහත් කුමරුගේ මුවට යසෝදරාවත කවියා නංවන "මැණික් කරඬු කට ලා කිරි බොන කුමරු" (ගම්ලත් සහ වික්‍රමසිංහ, 1998) යන යෙදුම මාතෘත්වයේ උත්තම බව කැටිකොට ගත්තකි. "ගීත රචකයා දක්වන "ළැම කිරි බරිනි නැමුනේ" යන යෙදුමෙහි දාරක ස්නේහයේ අපරිමිතය ගැබ් වෙයි. "

පරපුරක අමරස" යනු ළදරුවාට අවශ්‍ය සියලු පෝෂක කොටස් මවගේ රුධිරයට මුසු වී කිරි බවට හැරීම යි. "ළයේ ගලා යන රුහිර කිරට හරවාලා, ලොව ම නිවන අම්මා" (පෙරේරා, 2019) ගීයෙහි අර්ථය ද මෙයට සාම්‍යය ය. මව් කිරි රසභාව පූර්ණ පෝෂකයකි. දරුවාගේ ස්නායු පද්ධතියේ සක්‍රීය බව ද කිරි උරා බීමෙන් සිදු වෙයි.

නූතන ගර්භිණියක මුහුණ දෙන කටුකාමය යථාර්ථය ගීතයේ දක්වන කරුණුමය යථාර්ථයට ගැළපිය නො හැකි ය. දෛනික ජීවිතය පවත්වා ගැනීමට වෙහෙසෙන කාන්තාවකට සාපේක්ෂ ව නූතන ගර්භිණියකගේ චර්යාව සුවිශේෂ නො වන හෙයින් ආනුභවික තත්වයක තැබිය නො හැකි ය. දෛනික වේතනය හෝ මාසික වේතනය වෙනුවෙන් දිවා-රාත්‍රී නො බලා වැඩෙහි යෙදිය යුතු යාන්ත්‍රණයේ ගර්භිණියට යැයි සුවිශේෂ නිදහසක් හිමි නොවෙයි. මව සහ දරුවා වෙනුවෙන් කාර්මික සමාජයෙන් විවේකයක් ලැබෙන්නේ ප්‍රසූතිය සඳහාය. වෙළඳපළ ආර්ථිකයක මවගේ සහ දරුවාගේ අවශ්‍යතා ස්වාමියාට තනිව සාධනය කළ නොහැකි අවස්ථා තිබේ. ඇය දරුවා බිහි වූ පසු ජීවන තත්වය සුසංවාදී ව පවත්වා ගෙන යාම වෙනුවෙන් ස්වකීය ශක්තියෙන් වාණිජ සමාජයේ සක්‍රිය විය යුතුය. තාක්ෂණික නූතනත්වය දරුවාගේ හදගැස්ම මසකට හෝ මාස කිහිපයකට වරක් නිරීක්ෂණය කරයි. එහෙත්, කිරි බරින් නැවෙන ගර්භිණියක යන්න සුපෝෂණීය තත්වයකට සංකේතයකි. ඔහුගේම නිර්මාණයක දැක්වෙන "කිරි ශිරාවෝ ඉල්පී කෘෂ ළැමට ඇදී එත්මැ යි" යන්න ප්‍රස්තුත යෙදුම අභිභවා තථ්‍ය යථාර්ථයට සමීප ගෝචර වන යෙදුමක් ලෙස අද්‍යතනයට සමීපය. මවකගේ අවිඥාන ලෝකය රචකයා ස්පර්ශ කළද, ඇයගේ විඥානය සමග තුලනය කළ හැකි තාත්වික ලෝකය ගීතයෙන් නිරූපණය කිරීමට උත්සුක නොවූ බව කිව යුතුය.

මවට දරුවා කෙරෙහි සෙනෙහසක් හටගැනීමට ඇයගේ සන්තුෂ්ටියද හේතු වේ. ගීත රචකයින්ට සුලබ තේමාවක් වන මව් ගුණ මෙහිද සාම්ප්‍රදායික දෘශ්ටියෙන් විග්‍රහ කරයි. මවගේ කැපවීම සංවාදාත්මක ස්වරූපයෙන් නිර්මාණය කරන අවස්ථාවක් "මව සහ දුව" ගීතයේ නිරූපණය කරයි.

එන්නට පෙර ඔබ මෙලොවට
අම්මා හිටිය ද කියන්න
ඒ හින්දා දුවේ ඔබයි
ඒ රැජිනට හිමි ඔටුන්න ( විජේසිංහ,2018)

ස්ත්‍රියක් දියණියකව සිට මාතෘත්වය ලබන්නේ දරුවකුගේ උපත සමඟය. මාස නවයක් හෝ ආසන්න කාලයක් කුසෙහි ආරක්ෂා කර ලොව දරුණුතම වේදයිත මධ්‍යයේ මෙලොවට බිහි කළ ප්‍රේමයෙන්ද, තමන්ගේ මාතෘ පදවිප්‍රාප්තිය සනිටුහන් කළ හෙයින්ද ඇයට දරුවා කෙරෙහි පවතින්නේ තදාත්මීයත්වයකි. මවකගේ දාරක ස්නේහය ප්‍රමාණය කළ නොහැකිය. "මා වෙනුවෙන් වින්ද නොයෙක් -දුක් ගිනි නැත නිම්මා"(පෙරේරා, 1985) යන්න මවක දරුවෙකු වෙනුවෙන් දරුවා නොදරු අවධියේ සිදු කරන කැපවීම් හඟවයි. දරුවෙකුට දැකිය හැකි වන්නේ මවක දරුවෙකු වෙනුවෙන් සිදු කරන කැපවීම්වලින් අඩක් පමණි.

දිව රෑ දෙක නැතිව නින්ද
ළඟ හිටියා දැක්කෙ නැද්ද
මගෙ කෙහෙරැළි නිල් ඇස් දෙක
දැන් තියෙන්නෙ දුවට නේද ( විජේසිංහ,2018)

මාතෘත්වය යනු පරිත්‍යාගයකි. රත්න ශ්‍රී ගීතය පුරාම පිළිඹිබු කරන්නේ එයයි. දරුවා නොදත් මවගේ පරිත්‍යාගය මව ලවාම සියලු

දරුවන් වෙනුවෙන් ප්‍රකාශ කරවයි. දරුවන් වෙනුවෙන් මවගේ කැපවීම දිවා-රාත්‍රී භේදයකින් තොරය. " උදේ දිවා රැය කඳුළුවලින් ඉපදිලා..." (පෙරේරා, 2019) දරුවන්ගේ වේදනාව වඩාත් සංජානනය වන්නේ මවකටය. ජීවිතයෙන් ජීවිතයක් ගෙනදී ආකර්ෂණීය පරිද්දෙන් වැඩෙන විට මවගේ ශක්තීන් ක්‍රමෙන් හීන වෙයි. දන්ත, කේෂ, ඡවි ආදී පංච කල්‍යාණය ස්ත්‍රියකගේ සුරූපී බව නිර්ණය කිරීමෙහි ලා අතීතයේ සිට පැවති අංගය. තාරුණ්‍යයේදී කාන්තාවක් සිය කායික සෞන්දර්යය වෙනුවෙන් විශේෂ අවධානයක් යොමු කරයි. එහෙත් මාතෘත්වය වෙනුවෙන් ඇය සියල්ල පරිත්‍යාග කරයි. මාතෘත්වය සියලු ආශාවන් අත්හැරීමට තරම් පාරමිතාවක් වශයෙන් සලකති. මාතෘත්වය පිළිබඳ පූජනීයත්වයක් පවතින්නේද එහෙයිනි.

මවකගේ දාරක ප්‍රේමය සංවාදයෙන් හෝ විවාදයෙන් තීරණය කළ නොහැකිය. සමස්ත මානව ප්‍රජාවම ජීවිතය ලබන්නේ මාතෘත්වයේ කැපවීම් හේතුවෙනි. එහෙත්, අද්‍යතන පීඩාකාරී ජීවන ශෛලිය සෑම මවකටම උක්ත සද්භාවී ලක්ෂණ ප්‍රකට කිරීමට අවකාශ ලාබ නොදෙයි. දිවා සුරැකුම් මධ්‍යස්ථාන හෝ ආයම්මලා ඇසුරෙහි දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කරන්නට මව්වරුන්ට සිදු වී තිබේ. ශිෂ්ටාචාරයේ බැඳීම තහවුරු කළ ආධ්‍යාත්මික ගුණය වෙනුවට, නූතන කාර්මික ධනේශ්වරය ශ්‍රමය සූරා ගැනීමට අනවරත ප්‍රෝත්සාහයක නිරත වෙයි. මාතෘත්වය ද්විතියික කොට, වෘත්තීය තත්වය ප්‍රමුඛ කරවීම කාර්මික සමාජයේ පෙළඹවීම් මගින් සිදු වන්නකි. ඇරිස්ටෝටලියානු ප්‍රතිනිර්මාණවාදී කලාව විසින් නිර්මාණය කර ගත් අනුකාරකත්වය ගීතයෙන් ද ප්‍රතිනිර්මාණය කිරීම ආනුභවික තත්වයක් ගීතයෙන් නිරූපණය වීමට බලපා තිබේ (අමරකීර්ති, 2017). එහෙයින් ගීතයේ යථාර්ථ ප්‍රතිනිර්මාණයට අවකාශ සීමා වෙයි. පරිභෝජනවාදය විසින් ස්ත්‍රියට පවරනු ලැබූ ප්‍රදර්ශනාත්මක ස්වරූපය ඇය පවත්වා ගත යුතු ය.

වියපත් වීම, රුව ගුණ හීන වීම කෘත්‍රිම ආලේපන, වියපත් බව ඖෂධ මගින් තාවකාලිකව සඟවා තබා ගැනීමට බොහෝ ස්ත්‍රීන්ගේ අවධානය යොමු වෙයි. නූතනයේ ඇතැම් මව්වරු තම දරුවන්ට නිසි කාල සීමාවෙහි නිසි පරිදි මව්කිරි හෝ ලබා දීමට මැළි වෙති. පරිභෝජනවාදී ලක්ෂණ උසස් කොට සලකන සමාජයක ආධ්‍යාත්මික මානව බැඳීම් තර්ජනයට ලක් වන්නේ නිතැතිනි. නූතන සමාජ විපරිවර්තනය විසින් ඇති කළ බලපෑම ගීත රචකයා ගීතයට අන්තර්ග්‍රහණය කර ගත්තේ නම් යථාර්ථයට වඩාත් සමමිතික වෙයි. හුදෙක් තථ්‍ය මාතෘත්වයේ ගෞරවනීය ප්‍රතිනිර්මාණයක් නොවී ප්‍රදර්ශනාත්මක භූමිකාවක් වශයෙන්ද නූතන මාතෘත්වය අවභාවිත වෙයි. මෙම ගීතයේදී රචකයාගේ සමාජ අන්වේෂණ ශක්‍යතාව යටපත් කර ඇත්තේ මාතෘත්වය පිළිබඳ රචකයා සම්ප්‍රදායික ගරු කිරීම හෝ පෞද්ගලික විඥානයයි.

මව ස්වකීය දරුවන් සැමටම එක සමානව සෙනෙහස පරිත්‍යාග කරන්නීය. සංස්කෘතිය හෝ සම්ප්‍රදායේ බාධක හේතුවෙන් මාතෘත්වය අභියෝගයට ලක් වෙයි. ඇතැම් ගෝත්‍රික සමාජවල ස්ත්‍රිය මුහුණ දෙන කටුකම අද්දැකීම වන්නේ දරුවන් බිහි වුණු පසු ඔවුන්ගේ ජන්ම නැකතෙහි අවාසනාව යැයි සලකා දරුවන් මරා දැමීම හෝ වෙනත් නිවසකට පිටුවහල් කිරීමේ ගෝත්‍රික ආකල්පයයි. මෙම තත්වයට සමාන තත්වයක් ලංකාවේද ගැහැණු දරුවන් සම්බන්ධව පැවති බව එදා හෙළදිව කෘතියේ දක්වා තිබේ (නොක්ස්, 2014). මාතෘත්වය තමන් බිහි කළ සෑම දරුවෙකුටම සමානව සෙනෙහස දක්වන බව "හෙට ලොව ජයගනිමු" ගීයෙන් දැක්වෙයි.

පෙත්තෙන් පෙත්ත පිපි කුසුමකී
පෙති අතර දිසි හිඩැසකී
සුවඳින් එනමුදු අඩු නැතී
නුඹ මට කිසිදා වැඩි නැතී (පෙරේරා, 2015)

මවකගේ මාතෘත්වයේ අපේක්ෂාව සෞඛ්‍යවත් දරුවෙකු බිහි කිරීමයි. ස්වාධීනව ජීවිතය පවත්වා ගත හැකි පරිපූර්ණ කායික ස්වරූපය සහ යහපත් මානසිකත්වය දරුවෙකු සතු නොවීම මවට මානසික ව්‍යාකූලතා ඇති කරයි. දරුවා අසම්පූර්ණ කායික මානසික අවශ්‍යතා සහිත වීම මවට අනාගතය අවිනිශ්චිතතාවක් ඇති කරයි. සමාජ අපවාදද භුක්ති විඳීමට සිදු වෙයි. එහෙත්, සතර බ්‍රහ්ම විහරණ දරන මාතෘත්වය කුමන ඌනතා පැවතිය දරුවෙකුට වුවද, උපේක්ෂාවෙන් දාරක ස්නේහය පරිත්‍යාග කරයි.

හැමදාම අම්මා පාරමිතාවට
පින් පුරවන්නට ආ
දේව දූතියකි නුඹ දියණී
ඒ මා මහ පින් කළ බැවිනි (පෙරේරා, 2015)

කායික වශයෙන් දුර්වලතාවක් සහිත දියණියක සිටින මවකගේ සංවේදී භාව සමුච්ඡයක් ගීත ඛණ්ඩයෙහි අන්තර්ගත ය. ඇය සිය දියණිය පිළිබඳ අනාගත අපේක්ෂාවක් දල්වා ගැනීමට දූරදර්ශී වන්නේ ඇයගේ අනාගත අභියෝගය වැටහෙන හෙයිනි. "පින් පුරවන්නට ආ, දේව දූතියක" ලෙස මාතෘත්වයෙන් දියණියව ආමන්ත්‍රණය කරයි. ආගමික ඉගැන්වීම් අනුව මෙවන් තත්වයක් කුශලාකුශල කර්ම විපාක මත පවරයි. ගතානුගතික සමාජය මෙය මවගේ වරදක් ලෙස සලකා ඇයට නින්දා කරයි. මව සහ දරුවා කෙරෙහි ලෝකයාගේ දෘෂ්ටිය ඍණාත්මක වුවද මව දරුවා ව ධනාත්මක ව උපේක්ෂාවෙන් දකියි. සමාජයේ පූර්ණ වශයෙන් තහවුරු කළ හැකි ළමා ආරක්ෂණයක් කිසිඳු යුගයක නොවීය. දරුවෙකුගේ පූර්ණ ආරක්ෂාව තහවුරු වන්නේ මවගෙනි. යමෙකුගේ කායික- මානසික ගැටලු සමාජයේ උපහාසයට ලක් වුවද, මව දරුවා සනසයි. සාගර පලන්සූරියගේ "අන්ධ ළමයා"කවි පන්තිය ගීතය සමඟ සිහිපත් වන්නකි.

ඇයි අම්මේ අඬන්නේ මේ කඳුළු සලා
මට දැනෙනවා යයි මගෙ අත් දිගට ගලා
නාඬන් අම්මෙ නාඬන් මම විහිළු කළා ...(පලන්සූරිය, 1967)

මව නිහඬව තම දරුවාගේ අඳ බව හේතුවෙන් පශ්චාත්තාප වෙයි. එහෙත්, දරුවාගේ මානසිකත්වය යහපත් අයුරින් පවත්වා ගැනීම වෙනුවෙන් ඇය ඍජු ආත්මවිශ්වාසයක් පවත්වා ගනියි. සමාජ යථාර්ථයේ විග්‍රහ නොකළ අඳුර ඇය ඉදිරියේ දෘශ්‍යමානය.

නූතනත්වය හමුවේ නොසැලෙන, මාතෘත්වයේ කෘතඥතාව අගයන උත්තමාවරු සැම තැන්හිම සිටිත් ද? යන්න තථ්‍ය යථාර්ථය සමග ගනුදෙනු කිරීමේදී නැගෙන පැනයකි. මානව සමාජ විඥානයේ සුභවාදී තත්වයක් ගීතයෙන් නිරූපණය කරයි. පොදු සාහිත්‍යයේ විශ්වීයත්වය ගීතයේ ගැබ් නොවන්නේ කවීකාවගේ මනෝභාව නිරූපණය කෙරෙහි අවකාශය වෙන් කර ගෙන තිබීමෙනි. "ගොළු දරුවෙක් වුණා කියලා අනේ අම්මේ මාව" ගීතය ප්‍රතිනිර්මාණය කරන රූපමය යථාර්ථය සමාජයේ යථාර්ථයයි. නූතනයේ ශේෂ වී පවතින සම්ප්‍රදායේ පෙළඹවීම් ඔස්සේ මාතෘත්වය තථ්‍ය වටිනාකම් අභියෝගයට ලක් කරයි. පෘථග්ජන මානසිකත්වය විසින් ප්‍රතික්ෂේප කරන කායික හෝ මානසික දුර්වලතා මාතෘත්වයේ උපේක්ෂාවෙන් වුවද දරා ගැනීමට අද්‍යතන සමාජ විපරිවර්තන හමුවේ මව්වරු අපොහොසත් වෙති. අතළොස්සක් මව්වරු ධනාත්මක ආස්ථානයක පැවතුණද, තරගකාරීත්වය සමඟ ධාවනයේ යෙදීමට අවශක්තියක් සහිත දරුවන්ගේ ඉරණම ළමා නිවාසයක හෝ අනාථ නිවාසයකට සීමා වන අවස්ථා ඉහළ යාම නූතන ප්‍රවනතාවකි. පරත්වාවරෝපණය මෙබඳු දරුවන්ගේ ජීවන ඛේදයිතයේ උච්ඡතම තත්වයයි. ගීතයෙන් සාදෘශ්‍ය සමාජ යථාර්ථය නිරූපණය නොකළ ද මෙවන් අවස්ථාවක ළමුන්ගේ අනාරක්ෂිත බව,

සාක්ෂරතාව, ස්වාධීන පැවැත්ම තහවුරු කර ගැනීමට මාර්ගෝපදේශනය ලබන්නන්ගේ ප්‍රවනතාව සීමා වීම වැනි ගැටලු රාශියක් සමාජයේ ඇති වෙයි. එය පැවැත්ම කෙරෙහි වන අර්බුදයකි.

ප්‍රබුද්ධ කෘතියේ අම්මා වෙනුවෙන් පිදෙන උපහාරයෙහි දැක්වෙන මවගේ ජීවිත පරිඥානය ගීත රචකයින් රැසකටම අනුභූති සැපයීය.

ඇවිද ලඳු දෙනි කැලෑ බිම්වල
රැගෙන විත්තුන්හිරිය පන් කොළ
රටාවක් බව මේ මහා විශ්වය
කුඩා කල සිට ම මට කියා දුන් අම්මාට (සේකර, 1977)

ගමෙන් ඔබ්බෙහි ලෝකය පිළිබඳ අවිඥානික වුද, ඇය සතු ජීවිත පරිඥානය අපරිමිත විය. සේකරයන්ගේ ආභාසය ලද කවියෙකු මෙන්ම ගීත රචකයෙකු වන රත්න ශ්‍රී කවියාගේ ගීතවල ද, සේකරගේ අම්මාට සමාන මවක් හමු වෙයි.

අම්මා වැළලූතැන
හේනේ දෙණිකඩ ළඟ
මා හැඬුව කඳුළු ඇති
මට පෙවූ කිරිත් ඇති තවමත් ( විජේසිංහ, 2018)

මව මිය ගොස්ය. දරුවා වියපත්ය. එහෙත් මව් සෙනෙහස ජීවමාන ලෙස මතකයේ රැඳී තිබේ. ඇය සිදු කළ කැපකිරීම් එකිනෙක මනසට නැගෙයි. එහෙත් සිත වික්ෂිප්තව හැසිරෙයි. මාතෘ ස්නේහය කාලය සමඟ අමතක කළ නොහැකි අපරිමිත වූවක් බව කවියා ප්‍රකාශ කරන්නට උත්සාහ කරන්නේ,

ඇයි දෝ හොයන්න බැරි
ඇයි මට හඬන්න බැරි ( විජේසිංහ, 2018)

යන සංවේගජනක ප්‍රකාශයෙනි.

සොහොන පා මුල පැන් වැඩූ තැන
බිම බලාගත් නා ගහක් ඇති
කාත් කවුරුත් නැතැයි හිතුණම
නා ගහට දුක හිතෙනවා ඇති (විජේසිංහ, 2019)

මවගේ උණුසුම සදාකාලිකවම ප්‍රාර්ථනා කරන පෘථග්ජන මානසිකත්වය සුසානය අසල රැඳෙයි. අම්මාගේ සෙනෙහස ගායනා කරන්නට හෝ ආචාර පුදන්නට නොහැකිව නිහඬ ව සිටින්නේ නාග වෘක්ෂයක් මෙන් ගෞරවනීයවය. මානව සබඳතා උපකරණීය තත්වයට පත් වී ඇති හෙයින් ඇයගේ මානවීය ලක්ෂණ යාන්ත්‍රික සමාජයේ ප්‍රකට නොවේ. සමාජයේ කාර්මික සංකල්ප, යාන්ත්‍රික වීම මනුෂ්‍යත්වය කෙරෙහි සිදු කර ඇති බලපෑම පවුල් සංස්ථාව කෙරෙහි ඍජුව බලපා ඇත.

දරුවන් සමාජානුයෝජනය කිරීමේ පවුලේ කෘත්‍ය මව ඉටු කරන්නේ නැළවිලි ගීයේ සිටමය.

ඔබේ නැළවිලි ගීයදෝ
මා මුවින් ගිලිහෙන්නේ (විජේසිංහ, 2019)

"ළදරුවාගේ පරිසරයේ වැදගත්ම පුද්ගලයින් වන්නේ මව සහ පියායි" (හේමන්ත, 2001). මවගේ සෙනෙහස, දයාව සංලක්ෂිත නැළවිලි ගීය දරුවන්ගේ අනාගත අභිවෘද්ධිය සාධනය කරන්නේ නිතැතිනි. නැළවිලි ගීතය මාතෘත්වය සමඟ සංයෝජනය වන්නේ අතීතයේ සිටය. අම්මා දරුවා නිදන තුරු ගයන "දෝයි අම්මා-දොයි දොයියා, බායි

අම්මා-බයි බයියා" (විජේසිංහ, 2019). නැළවිලි ගීයෙන් ලොවට ආදරය උගන්වයි. නිර්ව්‍යාජ සහ අල්ලසින් තොර ආදරයක් ලබා දෙන මවගේ නැළවිලි ගීය දරුවාට නිර්ව්‍යාජව ජීවත් වීමේ පූර්වාදර්ශය සංජානනය කරයි. කවියා ජනකවියේ ආභාසය ලබමින් ස්වකීය පබැඳුම නිර්මාණය කිරීමෙන් ගීතයේ නව්‍ය ස්වරූපයක් ප්‍රකට වෙයි. ජංගම දූරකථනය හෝ රූපවාහිනිය වැනි විද්‍යුත් මාධ්‍යය සමඟ වඩාත් සමීප නූතන පරම්පරාවේ මව, නැළවිල්ල හෝ නැළවිලි ගීයේ හිමිකාරියක් බවට පත් නොවේ. මවගෙන් උරුම වූ ගීයක් අවිඥානයෙන් ගෙන ගයන්නට නොහැකි ය. නූතන මවට දිවා කාලය කාර්යබහුලය. එහෙයින්ම, රාත්‍රිය වෙහෙසකරයඃ නිදි බරය. තාක්ෂණයේ ආශිර්වාදයෙන් ළදරුවා නිදි සුව ලබයි. ආහාර ගනියි. මවට එහි නිනව්වක් නොමැත. විශේෂයෙන්ම දූරකථනය සහ රූපවාහිනිය වර්තමාන දරුවාගේ තනි නොතනියට හිඳියි. ගීතයෙන් නිරූපණය වන්නේ දශක කිහිපයකට පෙර යථාර්ථවත් වූ තත්වයක් හෙයින් එය වර්තමානයට හාත්පස වෙනස් සහ දුර්ලභ අවස්ථාවකි.

මව දරුවාව සිය උපරිම ශක්තියෙන් ආරක්ෂා කරයි. සමාජය පිළිබඳ උගන්වයි. ජීවිතයේ සත්‍ය ස්වභාවය ඇයට හෝ ඔහුට පහදා දෙයි.

ජීවිතයේ හැමදාමත්
මා ළඟ ම යි හිතන්න
ඒත් ඔබට සිදු වෙනවා
තනිව ම ලෝකය දිනන්න ( විජේසිංහ, 2018)

මව නොමැති ව තනිව ජීවත් වන ලෝකය පිළිබඳ සිතීමට හෝ බිය වන තරමට මව දරුවන්ට සමීප ය. එහෙත් ඇයගේ අවධාරණය පූර්ව සූදානමකි. දරුවන්ට අනන්‍ය වූ ජීවිතය නිර්මාණය කර ගැනීමට ඇය

නිදහස ලබා දෙයි. තථ්‍ය යථාර්ථයේ මවකගේ අපේක්ෂාවද එයයි. නිදහස් සමාජයට කුඩා කල පටන් ම දරුවා අනුගත කිරීම සිදු වෙයි. මවකගේ සමාජානුයෙෝජන කාර්ය භාරයේ විශ්වීයත්වය රචකයා මෙහිදී විස්තර කරයි.

**මවගේ දූරදර්ශී බව**

මව දරුවාව නැණ සහ ගුණයෙන් වර්ධනය කරයි. දරුවාගේ ජීවිතය සුනිසි මගකට යොමු කරයි.

ගුරු ගෙදර යන පාර අහගෙන
පුංචි මා උකුලට වඩාගෙන
පයින් ගිය අම්මේ
හෝඩි පොත්වල පිපුණු මල් මට
ඔබ නෙළා දුන්නේ (විජේසිංහ, 2019)

දරුවන් මිනිසුන් කිරීම පමණක් නොව වියතුන් කිරීමටද මව උත්සාහවත් වෙයි. ඇයට අභියෝගයක් වී ඇති ලෝකය, නොදත් ශිල්පය දරුවන්ට සුහුරු කිරීම මවගේ අපේක්ෂාවයි. රචකයා දක්වන මව "ගුරු ගෙදර යන පාර අහගෙන" යන්නෙන් මවට ආගන්තුක අධ්‍යාපන මාර්ගයේ දරුවා රැගෙන යන බව කියවෙයි. ජීවන ගැටලු මධ්‍යයේ ස්වකීය ධෛර්යයෙන් දරුවාගේ සුබ විහරණයත්, ශිල්පයත් පිහිටු වීමට, කටුක බව වළඳන මව්වරු අද්‍යතනයේ දුලබ නො වෙති. දරුවන්ගේ හෙට දිනය පිළිබඳ චෛතසික ගැටුම් ඇති කරගනිමින් සංකීර්ණ කල්පනා මව දරයි. සාපේක්ෂ ව සුසංවාදී බවින් අඩු සමාජයක දරුවන්ට තනි ව ජීවත් වීමට සිදු වන හෙයින් සත්‍යය පහදා දීම මව වගකීමක් ලෙස සලකන්නේ එහෙයිනි. ඇය ස්වභාව සෞන්දර්ය ද, මානව දයාව ද ඉගැන්වූ පළමු ආචාර්යවරිය ලෙස සාහිත්‍යයේ වර්ණනයට ලක් කරයි. අද්‍යතනයේ පෙරපාසල, පාසල, විශ්වවිද්‍යාලයද ඉන් ඔබ්බටද දරුවන්

සමගම රැඳෙන මව ශිල්පයේ පරතෙරට ගිය විශිෂ්ටයෙකු නිර්මාණයට උත්සුක වෙයි. රචකයාගේ මෙම නිර්මාණය හුදෙක් මවක පිළිබඳ ආනුභවික යථාර්ථය ග්‍රහණයට දැරූ තැතක්ම නොවේ. සමාජ නිරීක්ෂණය ඔස්සේ නිර්මාණය කරන මාතෘ භූමිකාවේ රූපමය යථාර්ථය ගැබ් කරමින් මවගේ ආධ්‍යාශය සමාජ විද්‍යාත්මකව ග්‍රහණය කර ගනියි.

සම්භාව්‍යය සාහිත්‍යයේද විවිධ මාතෘ භූමිකා සම්මුඛ වෙයි. පටාචාරා වෘත්තාන්තය ඒ අතුරින් සුවිශේෂය. සිය දෙමව්පියන්ගේ අණට අකීකරුව විවාහ වූ පටාචාරා ඛේදවාචක රැසකට මුහුණ දෙයි. පටාචාරා නව්‍යාකාරයෙන් ප්‍රතිනිර්මාණය කරන රචකයා "දිරිය මව- දියණිය" වශයෙන් ඇයව නම් කරයි.

කටුත් එක්ක පොර බදලා
මල් පෙති දැන් යකඩ වගේ
ලේ කිරි වන දවස ඒවි
නාඩා ගෙට වරෙන් දුවේ (විජේසිංහ, 2021)

දරුවන්ට ඉගැන්වීමට, අනන්‍ය වූ ජීවිතය සුනිසි පරිදි අත්කර දීමට මෙන්ම, අනවබෝධයෙන් සිදු කළ වරදට සමාව දීමටද මව පසුබට නොවේ. දියණිය ජීවන ගැහැට රැසකට මුහුණදී පීඩිතව පැමිණි විගස ඇයව නිවසට භාර ගන්නේ දිරිය කාන්තාවක් වශයෙනි. ස්වාමියෙකු නොමැතිව විවාහක දියණියක් යළි නිවසට පැමිණීම සංස්කෘතික සමාජයක ගැටලු රාශියක ආරම්භයකි. අම්මා විමසුවේ තනිව පැමිණීමට හේතුව පමණි. එයද දියණියගේ ආරක්ෂාව වෙනුවෙනි. ඇයට "නාඩා ගෙට වරෙන් දුවේ" යන ප්‍රකාශය නිර්ව්‍යාජව ප්‍රකාශ කළේ දියණිය පිළිබඳ සෙනෙහසිනි. ලෝකයෙන් කිසි විටෙක බලාපොරොත්තු විය නොහැකි කාරුණික සෙනෙහසක් මවක සතු වීම දෙවරක් නොසිතා ක්ෂමා කරවන එකම ශානත්තිවාදිනිය මව වීමට හේතුවයි. පවුල්

සංස්ථාවක සුරක්ෂිතතාව ගොඩනැගෙන්නේද එබැවිනි. වර්තමාන සමාජයට අවශ්‍ය වන්නේද එවැනි මාතෘ භූමිකාය.

**මාතෘ භූමිකාවේ නූතන ස්වරූපය**

නූතන මවගේ භූමිකාව සම්ප්‍රදායෙන් දුරස් වූවකි. ඇයගේ අභියෝග, අරමුණු නව්‍යාකාරය. නූතන මව ගීතවලට වස්තු විෂය කරගෙනතිබෙන්නේ අල්පවය. "අම්මේ" යන තේමාවෙන් රචිත රත්න ශ්‍රී විජේසිංහයන්ගේ ගීතය අද්‍යතන මවගේ යථාර්ථයේ ප්‍රතිනිර්මාණයකි.

පලවැල පිරී- එළවළු පැසේ
පිටිකිරි එරී වැල් කූඩයේ
වැඩ ඇරී එයි ගොම්මන් වෙලේ
අම්මා පුරා හඳ සේ (විජේසිංහ, 2021)

න්‍යෂ්ටික පවුලක මව හා දරුවා අතර සබඳතාවය මූලික වේ (අමරසේකර, 1984, උද්ධෘතය: කරුණාතිලක:55). එහෙත්, කාර්මික සමාජයේ මව්වරුන්ට බහුවිධ භූමිකා නියෝජනය කළ යුතුව ඇත. ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය අභිභවනය කළ ලිබරල් සමාජයේ මාතෘත්වයද වාණිජ්‍යය යථාර්ථය සමග සට්ටනය විය යුතු තත්වයට පත් කර තිබේ. දරුවන්ගේ ආශ්‍රයේ රැඳෙමින් උණුහුම, රැකවරණය ලබා දීම හෝ පරිසරය පිළිබඳ උගන්වන්නට මවට අවකාශය හිමි කර දී නැත. දරුවන්ගේ පෝෂණය සරි කරන පවිත්‍ර චේතනාවෙන් ඇය මිල දී ගත් පලතුරු සහ එළවළු කූඩයක් නිවසට ගෙන එන්නී ය. පියයුරු පුරා කිරි නො මැත. සංවර්ධනයේ දුෂ්පෝෂණය එයයි. ඇයට දරුවන්ගේ පෝෂණයට කිරි වර්ග වෙළඳපළෙන් මිල දී ගැනීමට සිදු වී තිබේ. " පිටිකිරි එරී වැල් කූඩයේ" යන්න නූතන සමාජය කෙරෙහි සියුම් උපහාසයක් හෙළයි. වැල් කූඩය රික්ත බහුල ධනේශ්වරයේ සංකේතයයි.

එරුණු මව් කිරි පෝෂණ ගුණයෙන් හීනයː ද්‍රාව්‍ය බවින් යුක්තය. එහෙයින් ආර්ථික දිළිඳු බවෙහි සිදුරු අතරින් කුඩයේ නොරැඳී ගලා යයි. මානුෂීය හර පද්ධති ධනේශ්වරය අභියස පරිභෝජනය නොකර විනාශ වන ආකාරය එයින් විශද වෙයි. නූතන ජීවන අර්බුදය මවගෙන් ලෝකයට සිදු විය යුතු කුටුම්භ සංරක්ෂණයට මානුෂික නොවෙයි.

වාණිජ ආර්ථිකය විසින් සියල්ල හික්මවන සමාජ පසුබිම මව-පියා භූමිකා නොව සේවකයා, ශ්‍රමිකයා ඇගයීමට ලක් කරයි. එයින් සිදු වන්නේ, කුටුම්භ සංරක්ෂණය ද්විතියික අපේක්ෂාවක් වීම යි. දෛනික පැවැත්ම උදෙසා අවශ්‍ය මූල්‍යමය ශක්තිය නොමැතිව දරුවාගේ අවශ්‍යතා සපුරා ගත නොහැකි ය. දිවා කාලය පූර්ණ වශයෙන් වෘත්තියට කැප කරන්නේ එහෙයිනි. "වැඩ ඇරී එයි ගොම්මන් වෙලේ" සාම්ප්‍රදායික පියාගේ භූමිකාව මව වෙතද ආරෝපණය වී ඇති විපරිවර්තිත සමාජ ශෛලියෙහි නිරූපණයකි. ලිබරල් ආර්ථිකය විසින් මෙහෙය වන ආරූඪ ජීවිතය වාස්තවික අභිවර්ධනය ඉලක්ක කරගත්තකි. මවට එහි ගොදුරක් වීමට සිදු වී තිබේ. විඩාව, දවසේ කාන්සිය සමඟ නිවසට පැමිණෙන ඇය නිවසට සඳක් වෙයි. රචකයා සමාජය දෙස හෙළන උපහාසාත්මක දෘෂ්ටිය බිඳ දැමිය නො හැකි මාතෘත්වය උත්තීර්ණ ආස්ථානයක තබයි.

විසඳුම් පිඹී රිය වියරු වී
පුර වංකගිරි මහ මාවතේ
මරු වැලින් පැන සංසාරයේ
අසපුවට එන අම්මේ (විජේසිංහ, 2021)

ඝනීභූත සමාජ සංස්ථිතිය භෞතික සංවර්ධනය මුඛ්‍ය ව ක්‍රියා කරන්නකි. අධිවේගී ජීවන ශෛලිය දුෂ්කරය. මව ඊනියා සංවර්ධනයෙහි මුළා වූ සමාජයේ විඩාපත් වී පැමිණෙයි. ගොරතර ධනේශ්වරයේ බාධක ඉවත් කිරීමට ඇයට නොහැකිය. ඇය ඒ මතින් පැන නිවසට පැමිණෙයි.

රචකයා මව නිවසට පැමිණීම දක්වන්නේ අසපුවට පැමිණීමක් ලෙසය. අසපුව භාවනා යෝගීන් හෝ ධ්‍යාන වඩන්නන්ගේ නවාතැන හඳුන්වන නාමයකි. මිල මුදල්, කුරිරු බව, අයුක්තිය ආදියෙන් නැගෙන ඝෝෂාව නගරය පුරා පිරී තිබේ. උපයාගත් වේතනය සහ මිල දී ගත් අවශ්‍යතා මවගේ ජීවිතයෙහි සතුට නිර්මාණය කරන්නේ නිවසේදීය. නූතන මවගේ නිවුණු, දැමුණු බව ඇයට කෲර සමාජයේ නිරූපණය කළ නොහැකිය.

යයි දිවාකර අමනාප වී
කළුවරට භාරයි ජීවිතේ
හා පැටව් නො තියා හාමතේ
උණුසුම් කරන අම්මේ (විජේසිංහ, 2021)

ශක්තිය උපරිමයෙන් කැප කිරීමට මවට සිදු වෙයි. දිවාකර අමනාප වීමත්, කළුවරට ජීවිතය භාර කිරීමත් යථාර්ථ ලෝකයෙහි මව් දරු සබඳතාවට ලක් වී ඇති ඉරණම පවසයි. දහවල් කාලය සේවයට කැප වී නිවසට පැමිණෙන මවට දරුවන් සමග සතුටු වීමට කායික සුවතාවක් නොවෙයි. උදෑසන නිවසින් පිටත් වී, රාත්‍රියේ නිවසට පැමිණ නින්දට යන ජීවිතයේ තම දරුවන්ට සමීප වීමට කාලය අහිමි කරයි. සමාජානුයෝජනය, ආදරය දරුවා වෙනුවෙන් මවක විසින් සැපයිය යුතු වුවද, එකී කෘත්‍යය නූතන ප්‍රවාහයෙහි අර්බුදයට ලක් වී ඇත. යාන්ත්‍රික මිනිසුන් සමග ගනුදෙනු කරන දහවල රාත්‍රිය තෙහෙට්ටුවට කැප කිරීමට සිදු වීම මනුෂ්‍යත්වයේ වින්දනය දුරස් කරන්නකි. නූතන මව දරුවන් උණුසුම් කරන්නේ නිදන විට තුරුළෙහි තබා ගැනීමෙනි. දරුවන්ට ආදරය දක්වන්නේ විසිතුරු දේ සහ රසවත් ආහාර මිල දී ගෙනය. දරුවන් හා දෙමාපියන් අතර යහපත් චිත්තවේගී බැඳීමක් ස්ථාපනයට මින් අවස්ථාව සීමා වෙයි. දරුවාගේ පෞරුෂ සංවර්ධනයට මෙය බලපෑම් කරන බව දක්වන කරුණාතිලක,

පිබිදෙන කුසුමකට හිරු එළිය මෙන් කුඩා දරුවාට සෙනෙහස අවශ්‍ය ම දෙයකි. ... පරිණත පුද්ගලයෙකු වූ විට කරුණාව දයාව යන මානව ගුණාංගයන්ගෙන් හෙබි පුද්ගලයන් වන්නේ කුඩා අවධියේ දී මෙකී අවශ්‍යතාව නිසි ලෙස සම්පූර්ණ කළ දරුවන් බව සමාජ විද්‍යාඥයින්ගේ අදහස යි (කරුණාතිලක. 2011).

පවුල, දරුවන්, දරු සෙනෙහස, සම්ප්‍රදාය, වගකීම, ස්ත්‍රීත්වය, ජීවන අර්බුද වැනි ප්‍රශ්න ගැටලු රාශියක් නූතන මවගේ වගකීම් අතරට එක් වී තිබේ. ඇය සියල්ලටමනො  පසුබට වී පිළිතුරු සෙවිය යුතුය. ඇයගේ තත්වයට හෝ කාර්යයට විකල්පයක් නො වන බව යාන්ත්‍රික සමාජයේ අවධානයට ලක් නොවීම මාතෘ භූමිකාව ව්‍යාකූල කරවන්නට හේතුවකි. මවකගේ ආදරය, සෙනෙහස සහ පොදු සමාජයේ සංවාදයට ලක් වන සාම්ප්‍රදායික තේමා පමණක් පූර්ව ගීතවලට වස්තු විෂය වී තිබිණි. මෙම ගීතය කාල්පනික තත්වය අභිභවා ගිය යථාර්ථයට සමමිතික වන නිර්මාණයකි. රචකයාගේ සමාජ නිරීක්ෂණයේ සූක්ෂ්මතාව ප්‍රදර්ශනය කරන මෙබඳු අවස්ථා මාතෘත්වය ආශ්‍රිතව තවද තිබේ.

දුස් ස්වප්න දැස රිදවා
කඳුළින් ම යාවි සේදී
එන රෝග ව්‍යාධි පළවා
දරු රකිම් ධෛර්‍ය්‍ය පේවී (විජේසිංහ, 1990)

ස්වාමියා නිවසින් නික්ම යන්නේ දිනකට හෝ දෙදිනකට පමණක් නොවේ. මාස ගණනක් දුර බැහැර රැකියාවට යාමකි. ඇය දරුවන් සමඟ නිවසේ තනිව වාසය කළ යුතුය. රාත්‍රියේ නිවසින් බැහැරට ගොස් ඖෂධ හෝ ලබා ගැනීමට නොහැකි සංස්කෘතික සීමා මධ්‍යයේ ඇය ප්‍රබල අභියෝග රැසකට මුහුණ දීමට සූදානම් විය යුතුය. "දුස් ස්වප්න" යනු නරක හෙවත් අසුබ සිහින යන්නයි. ස්වාමියා නිවසින්

නික්ම ගිය පසු ඇය ජීවත් වන්නේ චකිතයෙනි. ස්වාමියාගේ ආරක්ෂාව මෙන්ම දරුවන්ගේ රැකවරණය පිළිබඳවද ඇය පසු වන්නේ බියෙනි. මන්ද්‍රි දේවිය දරුවන් දන් දීමට පෙර දින රාත්‍රියේ දුටු සිහිනය සිහිපත් කරවන රචකයා නූතන සිහිනයේ සංකීර්ණතාව පාරමිතා පූරණය කළ බෝසතුන්ගේ බිරිඳගේ සිහිනයට වඩා හාත්පසින් වෙනස් වූවක් බව පහදයි. නපුරු සිහින දුටුව ද ඇය ව සනසන්නට ස්වාමියා ළඟ නොමැත. ඇය ස්ව ශක්තියෙන් කටුක ජීවනයට මුහුණ දිය යුතුය. එය පෞරුෂය ලෙස විග්‍රහ කළද දරුවන්ගේ ලෝකයේ එය ඌනතාවකි.

පුංචි පැටව් ගම් දොර තනියේ- ඉඳ
පාර බලාගෙන රෑ වෙන්නේ
අප්පා නැති මේ ගේ දොර පාලුයි
මොන රන් කඳ දෝ වැවෙන්නේ (විජේසිංහ, 2014)

ස්ත්‍රියක දරුවන් සමඟ තනිව ජීවන අරගලයට මුහුණ දීම අතිදුෂ්කරය. රැකියාවේ සුව පහසුව නොව කුසගින්නේ ප්‍රමාණය මත රැකියාව තීරණය කර ගැනීමට පියාට සිදු වී තිබේ. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හෝ වෘත්තිය තත්ව සමාජ සම්මත වැනි සංස්කෘතික සීමා අනායාසයෙන් බණ්ඩනය වූයේ මෙවන් ජීවන අර්බුද හේතුවෙනි. ස්වාමියා මිය යාම හෝ හැර යාම ස්ත්‍රියකට උරුම කරන කටුක ජීවනයේ අභියෝගාත්මක බව තීව්‍ර වන්නේ මවකටය. ගීත රචකයා විටින් විට මෙම ගීතය පිළිබඳ සිදු කර ඇති විග්‍රහ සහ ජීවන ප්‍රවෘත්ති අනුව ඔහුගේ පුළුල් ජීවිත පරිඥානයේ අංශුවක් නූතන සමාජයේ සාදෘශ්‍ය ස්වරූපය ගීතයේ අන්තර්ගත කිරීමට පිටුබලයක් වී තිබේ. ස්වකීය සමාජ අනුභූති විශ්වීය පරිචයෙන් ප්‍රතිනිර්මාණය කළ රත්න ශ්‍රී ගීත රචකයා ද සමාජයේ ගැටෙන සජීවී මිනිසෙකු බව යථාර්ථවත් නිර්මාණ ඔස්සේ ප්‍රකට කළ ගේය පද රචකයෙකි.

## මාතෘ භූමිකාවේ විපරිවර්තන කෙරෙහි බලපෑ තත්ත්ව

සමාජයේ සෑම වෙනස්වීමක්ම පූර්වයෙන් සන්නිවේදනය වන්නේ එහි ක්ෂුද්‍රම සහ කේන්ද්‍රීයම ආයතනය වන පවුලටයි. ඉන් මාතෘ භූමිකාවට සිදු කරන බලපෑම විශේෂයෙන් ගණනය නොකළද ප්‍රබලව සංජානනය කරවයි.

නුඹ චන්ද්‍ර මඬල වැන්නේ
සා පැටව් එහි නිදන්නේ
හාමතේ නො ලා දරුවෝ
නවතින්න බිසව් නගරේ (විජේසිංහ, 1990)

ධනේශ්වර සමාජ ප්‍රවාහය මානව අවශ්‍යතා අර්ධ වශයෙන් හෝ ඉටු කර ගත හැකි අවකාශයක් ලබා දෙන්නේ සීමිතවය. දරුවන් මවගේ ඇකයෙහි ලබන උණුසුමට සීමා වී සිටියි. පියා නිවසින් බැහැරව රැකියාවේ නිරත වීම ධනේශ්වරයේ නියෝගයක් හෙයින් ව්‍යර්ථ වුවහොත් ජීවිතය පවත්වා ගැනීමට නොහැකිය. මව සහ දරුවන් අතර පවතින සබඳතාව නිරූපණය කරන්නේ විචිත්‍රවය. "නුඹ චන්ද්‍ර මඬල වැන්නේ සා පැටව් එහි නිදන්නේ" යන්නෙන් බිරිඳගේ කටුක ජීවනය මධ්‍යයේ වුවද දරුවන් සහ මව අතර සුසංයෝගය විශිෂ්ටය. දරුවන් පෝෂණය කිරීම, උණුහුම් කරමින් නිසි මග පෙන්වීම ඇයට භාරය. ස්ත්‍රියගේ වගකීම් සමුදාය සංකීර්ණ වී තිබේ. එය ප්‍රශ්න නොකරම භාර ගැනීමට සමාජය හුරු වී ඇති බව ගීතයෙන් අනාවරිතය. සමාජ ක්‍රමය චින්තන ඌනතා ඇති කරන්නකි.

පිය සෙනෙහස මෙන්ම මව් සෙනෙහසද ලබා දිය නොහැකි ව මව්පියවරු තැවෙති. ආර්ථිකය එයට අභියෝගයකි.

පොඩි පුතා නැගිට රෑ මැදියම
හඬන වෙලාවේ
කිරි මවක වෙලා හීනෙන්
එනු මැනවි දේවියේ (විජේසිංහ, 1990)

දාරක ස්නේහය ලබා දෙන්නට ඇයට දෙවනුව සිතන්නට සිදු විය. පළමුව මුදල් පෙරට පැමිණ අවසන්ය. දරුවා තවම මව්කිරෙන් පෝෂණය ලබන දරුවෙකි. ආර්ථිකය විසින් නිවසේ කිරි සුවඳ පිටුවහල් කර අවසන්ය. "අම්මා එතෙර ගිහින්" ගීතයෙන් ප්‍රකාශ වන්නේද මව විදේශගත වූ පවුලක යථාර්ථයයි. වර්තමාන සමාජයේ ප්‍රබලම අර්බුදයයි.

රෑ හීනෙන් බය වෙලා අඬන
පුංචි මළණුවන්
ගී සිංදු කියා නළවගන්න
අපට බැරි තරම් (විජේසිංහ,2013)

මව්වරු විදේශගත වීම දරුවන් දැඩි අසරණ තත්වයකට පත් කරයි. දරුවන්ට ආහාර, සෙනෙහස, මවගේ රැකවරණය අහිමි වීම පූරණය කිරීමට විකල්පයක් නොමැත. ස්වාමියාටද අත් කරන තත්වය සුබදායක නොවේ. පවුල් සංස්ථාවක බිරිඳ සතු වී ඇති වගකීම් සමුදායම පියා මත යෙදවීමෙන් පවුල් සංස්ථාව ව්‍යාකූල වන අවස්ථා සුලබය. මව්වරු විදේශගත වීමෙන් රට සංවර්ධනයට විදේශ විනිමය ලැබුද, පවුල් ඒකකයේ ගුණාත්මක බව පරිහානියට පත් වීම ගණනය කළ නොහැකිය.

අතට වළලු බර වැඩිව නොවේ
උගස් කටට සින්න කළේ
කරට මාල ගොරහැඬි ද නොවේ
ණයට හිලව්වට ලිහී ගියේ (පෙරේරා, 1995)

ආදරය, සෙනෙහස පමණක් ජීවිතය පවත්වා ගෙන යන්නට ප්‍රමාණවත් නොවෙයි. පාලන රටා මගින් නිර්මාණය කර ඇති ආර්ථික විෂමතාව හේතුවෙන් මූලික අව්‍යශතාද සපුරා ගැනීමට නොහැකිව තැවෙයි. ස්ත්‍රිය විලාසිතා, ආභරණවලට ප්‍රියය. අතට වළලු, කරට මාල ස්ත්‍රියකගේ ආභරණ අතර සුවිශේෂ ය. එහෙත්, මැයට ඒවා අවශේෂ අවශ්‍යතා ය. මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා විසිතුරු විලාසිතා කැප කරයි. ආශාවට නොව අවශ්‍යතාවට ප්‍රමුඛත්වය ලබා දීම උපයෝගීතාව වුවද, පරිභෝජනවාදී ආර්ථික ක්‍රමවේද ඔස්සේ ගොඩ නගන ආටෝප සමාජය වෙලා ගෙන තිබේ. රටින් අඩකට වැඩි ජනතාවක් මූලික අවශ්‍යතා හෝ සපුරා ගැනීමට ක්‍රියා කරන්නේ සමස්ත සමාජයක් විසින් ක්‍රියාවට නගන ලෞකික අවශ්‍යතාවලින් පුද්ගල වටිනාකම තීරණය කරන පසුබිමකය.

අහස පොළොව යට ඉරට හඳට යට
නොලද සතුට නම් උයන් කොනේ
නුඹට උරුම ඇති පුංචි ඉඩක් ඇති
එතැනට යන මග සොයන් දුවේ (පෙරේරා, 1995)

නොලද සතුට නම් උයන් කොනේ යන්න සමාජයේ යථාර්ථය ගීත රචකයාගේ දෘෂ්ටියට ගෝචර වන බව පසක් කරන අපූරු යෙදුමකි. ජීවිතය විඳිනු වෙනුවට විඳවන්නට පරිධියේ මිනිසුනට මූලික අවශ්‍යතාද අරුමයකි. "නොලද සතුට නම් උයන් කොනේ- නුඹට උරුම ඇති පුංචි ඉඩක් ඇති- එතැනට යන මග සොයන් දුවේ" රචිකාව දක්වන්නේ තමන්ට සාධනය කර ගත නොහැකි වූ ජීවනාභිලාෂ තම දරුවන්ට හෝ සාධනය කර දීමට දෙමව්පියන් උත්සුක වන බවයි. අපටත් දවසක ඉර පායාදෝ යන බලාපොරොත්තුවෙන් යුතුව සිටින්නන් ගණනින් විශාලය. ධනවාදී සමාජය අපේක්ෂා කරන පුද්ගල සංවර්ධනය මානව ධර්මතා ද්විතීයික ස්ථානයක ලා සලකයි. ධනය, බලය, ශරීර වර්ණය, අධ්‍යාපනය, වෘත්තීය, සමාජ තත්වය මත තීරණය කරන පුද්ගල සංවර්ධනය විෂම

සමාජයෙහි ළඟා කර ගැනීමේ හැකියාව සියල්ලන්ටම හිමි නොවේ. තම දරුවන්ට ජීවිතයේ දියුණුව ලබා දීමට දෙමව්පියන් වශයෙන් නොයෙක් ප්‍රයත්න දරයි. බොහෝ දෙනෙකුට රැකියාව යනු සතුට උත්පාදනය කරන්නක් නො ව ජීවිතය පවත්වා ගන්නට අත්වැලක් පමණි. තරගකාරී සමාජයක සතුට ළඟා කර ගැනීමට උත්සාහය ප්‍රමාණවත් නො වන අවස්ථා සුලබය. ජීවන තෘප්තිය සපුරා ගන්නන් සාපේක්ෂ ව බලවතුන් වීම 1974 න් පසු ලාංකීය සමාජයේ ගීත රචකයින්ට වස්තු විෂය වී ඇති සමාජ පරිස්ථිතියෙහි දුර්ගම වූවකි.

දබර වෙවී බත ඉදෙනා කුල ගෙයි
කුස ගිනි මැඩ හිත ගිනි ඇවිලේ
ඈ ඉවසාගෙන සිටින තුරා ලොව
මේ තරමින්වත් ලිප මෙලොවේ (විජේසිංහ,2014)

පවුල් සංස්ථාවේ පැවැත්ම විෂයෙහි මෙම තත්ව සිදුකළ වාස්තවික මෙන්ම මානවීය බලපෑම් රාශියකි. ස්ත්‍රිය පීඩනයට පත් කරන සමාජ, සංස්කෘතික සීමාව ගීතය හෝ මානව අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින කලාංගයක් ලෙස නිරූපණයට කිසි අවකාශයක් නොවේ. ස්ත්‍රිය පුරුෂාධිපත්‍යය නඩත්තු කරන්නියක වශයෙන් පවත්වා ගැනීම නොකළ යුතුය.

**සමාලෝචනය**

අද්‍යතන සමාජ විපරිවර්තන හමුවේ ද පුද්ගලයා මුහුණ දෙන ජීවිතය විෂම ස්වරූපයක් ගෙන තිබේ. ගීත රචකයින් මව සහ දරුවන් අතර පවතින සබඳතාව සාම්ප්‍රදායික තත්වයේ සිට සුසංවාදී ව විග්‍රහ කිරීමට වැඩි නැඹුරුවක් දක්වා ඇත. මව පිළිබඳ පවතින භාවමය සංවේදීතාව එයට හේතුව වූ බව ගීතවලින් අනාවරිත ය. එහෙත්, නූතන මවගේ අර්බුදකාරී භූමිකාව ඇයගේ කාර්ය කොටස් ඉටු නො වන

තත්වයට පත් කර තිබේ. පවුල් සංස්ථාවක මානව බැඳීම් ගොඩනගන ප්‍රධාන ශක්තිය වශයෙන් ඇය මුහුණ දෙන අභියෝග සංවාදයට ලක් කළ යුතු ම ය. යමුනා මාලිනී පෙරේරා ද පුරුෂ මූලිකත්වය සහ සම්ප්‍රදාය අගයමින් ගීත රචනා කළ බව ප්‍රකට වන්නේ ස්ත්‍රී කාරකත්වය ඇය භාවිත නොකළ අවස්ථා හේතුවෙනි. සුනිල් සරත් පෙරේරාගේ ගීත සාහිත්‍යාත්මකව ඉහළ අගයක් සහිත රූපක භාෂාවකින් යුතු ය. එහෙත්, සාම්ප්‍රදායික මාතෘ භූමිකාව නිරූපණයට වැඩි අවකාශයක් වෙන් කර ඇත. රත්න ශ්‍රී නූතන සමාජ අර්බුද ආශ්‍රිත ව පවුල මුහුණ දී ඇති අභියෝග තථ්‍ය ස්වරූපයෙන් නිරූපණය කර ඇත. සුනිල් සරත් පෙරේරා සහ යමුනා මාලිනී පෙරේරාගේ ගීත මගින් ප්‍රතිනිර්මාණය කළ ආනුභවිකත්වය, රත්න ශ්‍රී විජේසිංහ ගී පද රචනා මගින් අභිභවනය කළ බව අධ්‍යයනයේ දී හෙළි විය. ස්ත්‍රීවාදීන්ට අනුව සමාජයේ ලිබරල් සංකල්ප සමග ගොඩනැගී ඇති ස්ත්‍රී විමුක්තිය සම්ප්‍රදාය අභිභවා පවතින්නක් බව කවිකාමය යථාර්ථයේ ක්‍රියාන්විත ය. එය සාහිත්‍ය ඔස්සේ ප්‍රතිනිර්මාණය කිරීමේ කර්තව්‍යය සාහිත්‍ය මගින් වඩාත් ප්‍රශස්ත අයුරින් නිරූපණය කළ යුතු ම ය. මාතෘත්වයේ යථාරර්ථය ප්‍රතිනිර්මාණය කෙරෙහි පිළිවෙළින් රත්න ශ්‍රී, යමුනා, සුනිල් සරත් වශයෙන් පෙළ අනුක්‍රමික ව පෙළගැස්විය හැකි ය. මෙයට සුනිල් සරත් පෙරේරාගේ ප්‍රස්තුත ගීත සංග්‍රහ ලිබරල්වාදී යුගයට අයත් වීමත් රත්න ශ්‍රී සහ යමුනාගේ ගීත පර්යේෂණයට ආසන්න ම 2020 සහ 21 වර්ෂවල කෘති ද ඇතුළත් හෙයින් නව ලිබරල්වාදී සමාජ විපරිනාම වඩාත් සූක්ෂ්ම ව ග්‍රහණය වී ඇති බව නිර්ණය කළ හැකි ය. අද්‍යතන ගී පද රචකයින්ට භාෂාව, සාහිත්‍යය සුභාවිතයෙන් ගීත නිර්මාණය කිරීමට මෙම නිර්මාණවලින් මාර්ගෝපදේශනය ලබා ගත හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ

ප්‍රාථමික මූලාශ්‍ර

පෙරේරා, යමුනා මාලිනි (2009). *බැබළීම වාගෙම බැස යාම අයිති සඳටයි.* කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

පෙරේරා, යමුනා මාලිනි (1995). *මා නෙතු මග හැර.* කොට්ටාවඃ සාර ප්‍රකාශන

පෙරේරා, යමුනා (2019). *සඳ පහන දැල්වී.* නුගේගොඩඃ සරසවි ප්‍රකාශකයෝ

පෙරේරා, යමුනා මාලිනි (2005). *සුවඳ මට දී.* කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

පෙරේරා, සුනිල් සරත් (1995). *මහකන්ද.* කොළඹඃ දයාවංශ ජයකොඩි සහ සමාගම

පෙරේරා, සුනිල් සරත් (2017). *සඳකත්මිණ.* නුගේගොඩඃ සරසවි ප්‍රකාශකයෝ

විජේසිංහ, රත්න ශ්‍රී (2014). *ආලකමන්දා* . නුගේගොඩඃ සරසවි ප්‍රකාශකයෝ

විජේසිංහ, රත්න ශ්‍රී (2021). *ගංගා ගීතය* . කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

විජේසිංහ, රත්න ශ්‍රී (2018). *මිණි බැඳි දොර* . කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

විජේසිංහ, රත්න ශ්‍රී (1994). *සුදු නෙළුම.* (සිව්වන මුද්‍රණය- 2018). කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

විජේසිංහ, රත්න ශ්‍රී (2019). *සුවඳ මුවරද.* නුගේගොඩඃ සරසවි ප්‍රකාශකයෝ.

ද්විතියික මූලාශ්‍ර

අබේසිංහ, මයුරි (2017). *ගීත රචනා කලාවේ විකාශනය.* කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

අමරසේකර,ගුණදාස (1996). *සිංහල කාව්‍ය සම්ප්‍රදාය.* බොරලැස්ගමුවඃ විසිදුණු ප්‍රකාශකයෝ.

අමරසේකර, දයා (2009). *සරල සමාජ විද්‍යාව.* කොළඹඃගොඩගේ සහ සහෝදරයෝ.

අමරසේකර, දයා (2016). *සාහිත්‍යය සමාජ විද්‍යාව.* කොළඹඃගොඩගේ සහ සහෝදරයෝ.

අමරකීර්ති, ලියනගේ (2017). *නව කවි සලකුණ.* නුගේගොඩඃ සරසවි ප්‍රකාශකයෝ.

ආරියපාල, එම්.බී. (2014). *මධ්‍යකාලීන ලංකා සමාජය.* අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේනත්තුව.

ආරියරත්න, සුනිල් (1986). *ග්‍රැමෆෝන් ගී යුගය.* (සය වැනි මුද්‍රණය- 2017). කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

ආරියරත්න, සුනිල් (2005). *නූතන ගේය කාව්‍ය සංහිතා.* (සය වැනි මුද්‍රණය- 2018). කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

ආරියරත්න, සුනිල් (2014). *විරුද සහ විරිදු.* ගොඩගේඃ කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

ඊරියගම, තිස්ස (2007). *සංක්ෂිප්ත ආර්ථික විද්‍යාව.*

කරුණාතිලක, ආර්.කේ. (2011). *පෞරුෂ සංවර්ධනය කෙරෙහි පවුලේ බලපෑමඃ* සමාජ මනෝ 23. විද්‍යාත්මක අධ්‍යයනයක්. කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

කුලතිලක, සී ද එස්. (1974). *ලංකාවේ සංගීත සම්භවය.* කොළඹඃ ලේක්හවුස්.

ගුණතිලක, ලයනල් (2013). *කතා පෙට්ටියේ ගී.* (දෙවන මුද්‍රණය). කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

ඤාණිස්සර, පාතේගම (2010). *සිංහල ගීතය සහ අපේ සංස්කෘතිය.* කොළඹː ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, මහින්ද. *සිංහල ගීතයේ පුරාණෝක්ති භාවිතය.* නුවණ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සිංහල භාෂා හා මානව ශාස්ත්‍ර අංශයේ ප්‍රකාශනː 1 වෙළුම.

පීරිස්, රැල්ෆ් ( 2005). *සිංහල සමාජ සංවිධානය.* බොරලැස්ගමුව.

පීටර්, කේ. ඒ.ඩී. (2019). *දෙමාපිය දූ දරු සබඳතා.* බොරැල්ලː විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

පෙරේරා, ටෙනිසන් බී.ඒ. (2014). *සමාජ විද්‍යාව සමාජය සහ සංස්කෘතිය.* කඩවත

පෙරේරා, ටෙනිසන් බී. ඒ. (2002). *මානව විද්‍යාව හා සමාජ විද්‍යා ප්‍රවේශය*-කොළඹː ගොඩගේ සහ සහෝදරයෝ.

බැද්දගේ, රෝහණ (2015). *ගම්මානෙන් උපන් ගීය.* කොළඹː ගොඩගේ සහ සහෝදරයෝ.

මනම්පේරි, මනෝරි (2017). *සින්දු විමසුම.* කොළඹː ගොඩගේ සහ සහෝදරයෝ.

මල්ලිකාරච්චි, ඩෙස්මන්ඩ් (2010). *මාක්ස්වාදය සහ සාහිත්‍යය විචාරය.* නුගේගොඩː සංහිඳ ප්‍රකාශන.

මස්සිඹුල, මහින්ද (2013). *ඇහි පියන් ඇහැරිලා.* සත්ථව ප්‍රකාශන

මල්ලිකාරච්චි, රේමන්ඩ්. ජේ (2010). *කාල් පොපර්- මාක්ස්වාදයේ ව්‍යාජ විවේචකයෙක්.* නුගේගොඩː සංහිඳ ප්‍රකාශන.

මැකියාවෙලී, නිකොලොයි (1513). *කුමාරයා* (The prince සිංහල පරිවර්තනය-ප්‍රේමචන්ද්‍ර අල්විස්) කොළඹː සූරිය ප්‍රකාශකයෝ.

මුතුතන්ත්‍රි, අචලා. (2019). *සිංහල ගීත සාහිත්‍යයේ විකාශය පිළිබඳ සෞන්දර්යාත්මක විමසුමක්.* කොළඹː ෆාස්ට් ප්‍රින්ටඩ්.

මුණසිංහ, චාමික (2008). *සිංහල ගීතයේ නූතන ප්‍රවණතා.* කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ

නොක්ස්, රොබට් (1681), *එදා හෙළදිව* (An History Relation of the Island o Ceylon සිංහල පරිවර්තනය- ඩේවිඩ් කරුණාරත්න) කොළඹඃ ගුණසේන සහ සමාගම

රත්නපාල, එන්. 1990, *අපරාධ විද්‍යාවේ මූලධර්ම*, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ

රත්නායක, මඩවල එස්. (1996). *ගී සින්දු සාහිත්‍යය.* (දෙවන මුද්‍රණය- 2017). කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

විජේතුංග, නවනැලියේ (2011). *අපේ ජනකවි.* කර්තෘ ප්‍රකාශන

විජේසුන්දර, අසේල (2019). *ගීතයකින් ජීවිතය කියවමු.* යක්කලඃ සන්ථව ප්‍රකාශකයෝ.

විජේසූරිය, සරත් (2009). *කවිකම් මනරම්.* (හතර වන මුද්‍රණය- 2019). බොරැල්ලඃ විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

වෙත්තසිංහ, සමුද්‍ර. (2005). *නව කවියේ චන්ද්‍රෝදය.* කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ

වේරගල, අරුණ (2008). *අත්දැකීම්, ගීතය සහ රත්න ශ්‍රී විජේසිංහ.* කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

සරච්චන්ද්‍ර, එදිරිවීර (1998). *සාහිත්‍ය විද්‍යාව.*( තෙවැනි මුද්‍රණය 1998). කොළඹඃ

ගොඩගේ සහ සහෝදරයෝ.

සුරවීර, ඒ. වී. (2005). *සාහිත්‍ය විචාර ප්‍රදීපිකා.* කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

සේකර, මහගම (2014). *ප්‍රබුද්ධ.* (දහහතරවන මුද්‍රණය). පන්නිපිටියඃ සීමාසහිත ස්ටැම්ෆර්ඩ් ලේක් (පුද්ගලික) සමාගම.

සේකර, මහගම (2018). *සිංහල ගද්‍ය පද්‍ය නිර්මාණයන්හි රිද්ම ලක්ෂණ.* (තෙවන මුද්‍රණය). කොළඹː ගොඩගේ සහ සහෝදරයෝ.

සෝරත, වැලිවිටියේ (2005). (සංස්). එළුසඳැස් ලකුණ. කොළඹ.

හරාරි, යුවාල් නෝවා (2011), සේපියන්ස්ලා (Sapiens සිංහල පරිවර්තනය- උපාලි රත්නායක) නුගේගොඩː සරසවි ප්‍රකාශකයෝ.

හේරත්, සමන්ත (2016) (සංස්). *මහගම සේකර හදවතේ ගීතය.* සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

Anderson, Michel (1971). Family Security and Family Breakdown. Penguin Book

Doxiadge, Spros (1979). The Child in the World of Tomorrow. Oxfordː Pergamon Press.

**<u>අන්තර්ජාල</u>**

එදා මෙදා තුර ගීතයේ මිහිරි මතක- ජ'පුර ගී කලාලය.( 2020-02-27). ලබා ගත්තා 2021. 05. 07. http: // www. fhss.sjp.ac.lk

"ගීත සාහිත්‍යයට නැවත ජීවය" (2019). ලබා ගත්තා 2021. 07. 29. සත්මඩල. http: // www. sathmadala. lk

තිලකරත්න, ප්‍රවීන්. (2020). සිංහල ගීතයේ හා කාව්‍යයේ දේශපාලනය, ලබා ගත්තා 2021 ඔක්තෝම්බර් 19. http: // www. patitha.lk

පෙරේරා, සුනිල් සරත්. (2016). සුනිල් සරත් පෙරේරා ගී පබැඳුම්, ලබා ගත්තා 2021 ඔක්තෝම්බර් 13. http: // www. sunilsarath.blogspot. com

සිරිනාථ, රසික. (2018-03-10). "සුනිල් සරත් පෙරේරා නම් මහා ගීත රචකයා". ලබා ගත්තේ 2021. 08. 07. සිළුමිණ නිවස

Murdock, G.P. (1949). Social Structure New York: The MacMillan Company.

**ශබ්ද කෝෂ**

සෝරත, වැලිවිටියේ. (1952). ශ්‍රී සුමංගල ශබ්දකෝෂය (ප්‍රථම භාගය) කොළඹඃ මහා බෝධි මුද්‍රණාලය.

හෙට්ටිආරච්චි, ඩී. ඊ. (1963) (සංස්.) සිංහල විශ්වකෝෂය, 1 වැනි කාණ්ඩය. කොළඹ.

**පුවත්පත්**

ආනන්ද, උඩුහාවර (2013, සැප්තැම්බර් 12). ප්‍රායෝගික ජීවිතයට බුදු දහම 05- මව්පිය දූ දරු සබඳතාව, http://www.budusarana.lk/budusarana/2013/09/12/tmp.asp?ID=vision06

**ශාස්ත්‍රීය සඟරා**

විජේබණ්ඩාර, නිලූකා. (2018) නූතන ශ්‍රී ලංකා සමාජය තුළ පවුලේ කෘත්‍යයන් හා මානව සම්බන්ධතා රටාවන්ගේ වෙනස්වීම පිළිබඳ විශ්ලේෂණයක් E- Journal of Social Work-. 3(1):38-48 https://nisd.ac.lk

වීරසේකර, ප්‍රියංකා ආර්. ඒ. ඩී. (2018- දෙසැම්බර්). *ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහගේ ගී පද රචනාවලින් මතු වන ශබ්දාර්ථ රස නිශ්පත්තිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්*, සබරගමු විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය, නවවැනි කලාපය 10-16. https://www.sab.ac.lk

හේමචන්ද්‍ර බී. එම්. එම්. එච් සහ යාපා එල්. ජී. ඩී. එස් (2018) *'ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ග්‍රාමීය- නාගරික සබඳතාවන්ගේ බලපෑම දඹුල්ල නගරය සහ එහි තදාසන්න ප්‍රදේශ ඇසුරින්'* සබරගමු විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සඟරාව(49-59). https://www.sab.ac.lk

සඳරුවන් කේ.ඩී එම්; විජේවර්ධන බී. වී. එන්.; ප්‍රේමරත්න, එල්.ඩී. එම්. (2017-දෙසැම්බර්). *ස්ත්‍රී-පුරුෂ සමාජභාවය තුළ පුරුෂයන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සඳහා බලපානු ලබන සාධක පිළිබඳ අධ්‍යයනයක්ඃ* Proceedings of 7th International Symposium" SEUSL (628-634), https://www.sab.ac.lk

**වෙනත්**

කෝපරහේවා, සඳගෝමි (2019). *සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය.* කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

කෝපරහේවා, සඳගෝමි (2020). *ශාස්ත්‍රීය ලේඛනයක මූලාශ්‍ර දැක්වීමේ විධික්‍රම.* කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

පරමානන්ද හිමි, පොල්ගස්වත්තේ (2016). *පර්යේෂණ නිබන්ධ අත්පොත.* කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.